වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report
2025

කම්කරු දෙපාර්තමේන්තුව
தொழில் திணைக்களம்
Department of Labour



2025 වර්ෂය සඳහා

වාර්ෂික කාර්යසාධන වාර්තාව

වැය ශීර්ෂ අංක 221

කම්කරු දෙපාර්තමේන්තුව

පෙළගැස්ම

පිටුව

පළමු පරිච්ඡේදය **ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**		**6**
1.1	හැඳින්වීම	7
1.2	දැක්ම, මෙහෙවර සහ අරමුණු	7
1.3	ප්‍රධාන කාර්යයන්	7
1.4	දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සහ ප්‍රධාන අංශ	8
1.5	දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්	12
දෙවන පරිච්ඡේදය **ප්‍රගතිය හා ඉදිරි දැක්ම**		**13**
2.1	සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය	14
2.2	සේවකයන්ගේ සමාජ ආරක්ෂණය	19
2.3	කාර්මික සාමය සුරක්ෂිත කිරීම	23
2.4	සේවකයන්ගේ නෛතික රැකවරණය	28
2.5	ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම	30
2.6	සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම	32
2.7	දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ මාධ්‍ය මගින් තොරතුරු සන්නිවේදන කටයුතු	34
2.8	දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණය	41
2.9	දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය	43
2.10	දෙපාර්තමේන්තුවේ කාර්ය අධීක්ෂණය මගින් ඉලක්ක කරා මෙහෙයවීම	43
2.11	මූල්‍ය කළමනාකරණය	44
තුන්වන පරිච්ඡේදය **2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය**		45
3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	46
3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	47
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	49
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	50
3.5	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	51

3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	51
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	51
3.8	මුදල් නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	52
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	53
සිව්වන පරිච්ඡේදය කාර්යසාධන දර්ශක		62
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	63
පස්වන පරිච්ඡේදය තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය		64
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	65
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ	66
5.3	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග	70
සයවන පරිච්ඡේදය **මානව සම්පත් පැතිකඩ**		71
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	72
6.2	ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය	72
6.3	මානව සම්පත් සංවර්ධනය	72
හත්වන පරිච්ඡේදය **අනුකූලතා වාර්තාව**		88
7.1	අනුකූලතා වාර්තාව	89

ප්‍රස්තාර

පිටුව

ප්‍රස්තාරය 2.1	2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව	15
ප්‍රස්තාරය 2.2	2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂිකව පරීක්ෂා කර අනුමත කරන ලද කර්මාන්තශාලා ගොඩනැගිලි පිඹුරුපත් සංඛ්‍යාව	15
ප්‍රස්තාරය 2.3	2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂිකව පරීක්ෂා කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව	16
ප්‍රස්තාරය 2.4	2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්තා වී විමර්ශන කටයුතු සිදු කරන ලද අනතුරු සංඛ්‍යාව	17
ප්‍රස්තාරය 2.5	2025 වර්ෂයේදී බලයලත් නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලැබූ අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා සංඛ්‍යාවේ වර්ගීකරණය	18
ප්‍රස්තාරය 2.6	2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලෙහි වර්ධනය	19
ප්‍රස්තාරය 2.7	2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාවේ වර්ගීකරණය	21
ප්‍රස්තාරය 2.8	2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාව	21
ප්‍රස්තාරය 2.9	සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවීම සඳහා ගතවූ කාලය - 2025.01.01.සිට 2025.12.31	22
ප්‍රස්තාරය 2.10	2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට අදාලව නිවේදන යැවූ සංඛ්‍යාව	23
ප්‍රස්තාරය 2.11	2025.01.01 සිට 2025.12.31 දක්වා මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු	29
ප්‍රස්තාරය 2.12	ජාතික අවම වේතන පනතේ විකාශනය	30
ප්‍රස්තාරය 2.13	2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් ලැබීම සහ අනුමැතිය ලබා දීම	31
ප්‍රස්තාරය 2.14	2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා දින 05 වැඩසතිය සඳහා ඉල්ලීම් ලැබීම සහ අනුමැතිය ලබා දීම	31

ප්‍රස්තාරය 2.15	2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි වලට අදාලව පරීක්ෂණ සිදු කිරීම	32
ප්‍රස්තාරය 2.16	2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා දේශීය පුහුණු වැඩසටහන් සඳහා දරන ලද වියදම් සහ පුහුණුව ලද නිලධාරීන් සංඛ්‍යාව	42

වගු

පිටුව

වගුව 6.1	දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2025	73
වගුව 6.2	විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2025	85

ඡායාරූප

පිටුව

ඡායාරූපය 2.1	තුල්හිරිය සහ පූගොඩ පේෂකර්මාන්ත ශාලාවල සේවය අහිමි වූ සේවකයින්ට වන්දි ලබා දීමේ සංකේතාත්මක වැඩසටහන - 2025.05.30	27
ඡායාරූපය 2.2	කළුතර - නාගොඩ කර්මාන්තපුරයේ කර්මාන්තශාලා වල සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන - 2025. 07.29	36
ඡායාරූපය 2.3	සුපිරිවෙළඳසැල් වල සේවයේ නියතු සේවකයින් සඳහා පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන - 2025.04.28	36
ඡායාරූපය 2.4	ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන 2025	38
ඡායාරූපය 2.5	ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය වෙනුවෙන් කොළඹ උතුර පොලිස් කොට්ඨාසයේ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශය ආවරණය වන පරිදි 2025.06.12 දින පැවැත්වූ ළමා ශ්‍රම විරෝධී පාගමන	39

පළමු පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 ආයතනය පිළිබඳ හැඳින්වීම

ශක්තිමත් සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් යනු රටක තිරසාර ආර්ථික සංවර්ධනයේ මූලික පදනම වේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමස්ත ශ්‍රම බලකායේ බහුතරය නියෝජනය කරනු ලබන පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින්, කාර්මික සාමය ආරක්ෂා කරමින් එම සේවක ප්‍රජාව වෙත සුනිසි වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ කාර්යභාරය සියවසකට වැඩි ඉතිහාසයක් පුරා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි. වර්තමානයේ දී ඩිජිටල් පරිවර්තනයක් කරා ගමන් කරමින් සිටින කම්කරු දෙපාර්තමේන්තුව, විද්‍යුත් සේවාවන් (e-services) හඳුන්වා දීම මගින් සේවාලාභීන් වෙත වඩාත් සමීපව, කාර්යක්ෂමව හා මනා විනිවිදභාවයකින් යුතුව සුහදශීලී සේවාවක් ලබා දීම සඳහා කටයුතු කරනු ලබයි.

1.2 කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර මගින් දෙපාර්තමේන්තුවේ සමස්ත ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි. "අන්තර්ජාතිකව තරගකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක්" යන දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුවේ මෙහෙවර වනුයේ "කම්කරු අයිතීන් ආරක්ෂා කරමින්, තහවුරු කරන ලද කාර්මික සාමය සහිත සුනිසි වැඩ පරිසරයක් තුළින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම" වේ.

කම්කරු දෙපාර්තමේන්තුව කම්කරු නීති රීති බලාත්මක කිරීමෙන් පමණක් නොනැවතී ශ්‍රමිකයාගේ අභිමානය රැකදෙමින් ආයතනික ඵලදායීතාවය ලඟා කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කර දෙනු ලබයි. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර මගින් උත්සාහ දරනුයේ සේවක අයිතීන් රැකගන්නා අතරම, ජාතික සංවර්ධනයට සෘජුව දායක විය හැකි තෘප්තිමත් සහ ගුණාත්මක ශ්‍රම බලකායක් නිර්මාණය කර ඒ තුළින් ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාව සතු තරඟකාරීත්වය ඉහළ නැංවීමට අවශ්‍ය තිරසාර කාර්මික සාමය ඇති කිරීම වේ.

1.3 කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම තුලින් ආයතන මට්ටමින් සේවා-සේවක සබඳතාවය ශක්තිමත් කරමින් කාර්මික සාමය සුරක්ෂිත කිරීම වේ. කම්කරු නීති බලාත්මක කිරීම මගින් සේවක අයිතිවාසිකම් තහවුරු කරන අතරම, කාර්මික ආරාවුල් පැන නැගුණු අවස්ථාවන්හිදී සාමදානයෙන් නිරවුල් කිරීම, සාමූහික ගිවිසුම් සහ බේරුම්කරණය වැනි ක්‍රමවේද ඔස්සේ එම ආරාවුල් නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුව සක්‍රීයව මැදිහත් වේ. එසේම, සේවක අර්ථසාධක අරමුදල මගින් සේවකයින්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීමට කටයුතු කරනු ලබන

අතර සේවා ස්ථානයන්හි වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සම්බන්ධයෙන් කටයුතු කරමින් සේවකයන්ගේ සෞඛ්‍ය තත්වයන්ට හිතකර හා අනතුරු රහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ කාර්යයද ඉටු කරනු ලබයි.

දැයේ දුවා දරුවන්ට සිය ළමා කාලය නිදහසේ භුක්ති විඳීමින් විධිමත් අධ්‍යාපන කටයුතු වල යෙදීමේ අයිතිය තහවුරු කිරීම උදෙසා ළමා ශ්‍රමය දිවයිනෙන් තුරන් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. එසේම, සේවයේ නියුක්ත කාන්තාවන්ගේ සහ තරුණ ප්‍රජාවගේ වෘත්තීය සුරක්ෂිතතාව සම්බන්ධයෙන්ද විශේෂ අවධානයක් යොමු කරමින් දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. වැටුප් හා සේවා කොන්දේසි ශක්තිමත් කරමින් ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කරන අතරම, කම්කරු ක්ෂේත්‍රයේ ප්‍රගතිය උදෙසා තීරණ ගැනීමට අවශ්‍ය දත්ත රැස්කිරීම, විශ්ලේෂණය සහ කාලීන තොරතුරු ප්‍රකාශයට පත් කිරීම ද දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව සිදු කරනු ලබයි.

1.4 දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සහ ප්‍රධාන අංශ

1.4.1 කම්කරු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සහ ප්‍රධාන අංශ

කම්කරු දෙපාර්තමේන්තුවේ සේවාවන් දිවයින පුරා ව්‍යාප්ත කිරීම උදෙසා ප්‍රාදේශීය ව්‍යුහයක් ස්ථාපිත කර ඇත. ඒ අනුව, ප්‍රධාන කාර්යාලයීය කටයුතු විෂය පථයන් 15 කට අදාළ ප්‍රධාන අංශ 15ක් මගින් සිදු කරනු ලබන අතර, සේවාලාභීන්ට වඩාත් සමීප සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම වෙනුවෙන් දිවයින පුරා විසිරුණු කලාප කම්කරු කාර්යාල 11ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක්, උප කම්කරු කාර්යාල 17ක් සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 කින් සමන්විත පුළුල් ජාලයක් ක්‍රියාත්මක වේ. මෙමගින් සේවාලාභීන්ට තම සේවා අවශ්‍යතා ප්‍රාදේශීය මට්ටමින් ඉටු කර ගැනීමේ පහසුව සැලසේ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 15 පහත පරිදි වේ.

- කාර්මික සම්බන්ධතා අංශය
- සේවක අර්ථසාධක අරමුදල් අංශය
- තොරතුරු තාක්ෂණ අංශය
- ශ්‍රම ප්‍රමිති අංශය
- කර්මාන්තමය සුරක්ෂිතතා අංශය
- වෘත්තීය ස්වස්ථතා අංශය
- කාන්තා හා ළමා කටයුතු අංශය
- නීති ක්‍රියා අංශය
- විශේෂ විමර්ශන අංශය
- සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය
- සංඛ්‍යාලේඛන අංශය
- පාලන අංශය

- ❖ මුදල් අංශය
- ❖ අභ්‍යන්තර විගණන අංශය
- ❖ ඉදිකිරීම් හා නඩත්තු අංශය

එම අංශයන්හි කාර්යභාරය පහත පරිදි වේ.

1.4.2 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයන්හි කාර්යභාරය

1.4.2.1 කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

සේවා ස්ථානයන්හි අනතුරු අවම කරමින් ආරක්ෂිත ශ්‍රම බලකායක් බිහි කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත හා එයට අනුකූලව සම්මතකර ඇති රෙගුලාසි යටතේ නව කර්මාන්තශාලා ලියාපදිංචි කරගැනීම, කර්මාන්තශාලා ගොඩනැගිලි පිඹුරුපත් අනුමත කිරීම, කර්මාන්තශාලා පරීක්ෂා කිරීම, අධිඅන්තරාදායී යන්ත්‍ර පරීක්ෂාව සහ නියාමනය කිරීම, අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සහ ආරක්ෂිත සේවා පරිසරයක් පවත්වා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

1.4.2.2 වෘත්තීය ස්වස්ථතා අංශය

ශ්‍රමිකයන් වෘත්තීය රෝගවලට ගොදුරු වීම වැළැක්වීම සඳහා සේවා පරිසරයේ සෞඛ්‍යාරක්ෂිත බව විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ පරීක්ෂා කිරීම, එම තත්ත්වයන් වලක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුම්වත් කිරීම සහ නිරන්තර පසු විපරම් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

1.4.2.3 සේවක අර්ථසාධක අරමුදල් අංශය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ ශ්‍රමිකයන්ගේ විශ්‍රාම දිවිය ශක්තිමත් කිරීම සඳහා 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් ස්ථාපිත කර ඇති සේවක අර්ථසාධක අරමුදලෙහි පරිපාලන කටයුතු මෙම අංශය විසින් සිදු කරනු ලබයි. සේවක අර්ථසාධක අරමුදල යටතේ සේවායෝජකයන් සහ සාමාජිකයන් ලියාපදිංචි කරගැනීම, සේවායෝජකයින් වෙතින් දායක මුදල් අයකර ගැනීම, සාමාජිකයන්ට හිමි ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබාදීම සහ අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

1.4.2.4 තොරතුරු තාක්ෂණ අංශය

සේවක අර්ථසාධක අරමුදල් අංශයට අනුබද්ධ ඒකකයක් වශයෙන් පැවති තොරතුරු තාක්ෂණ ඒකකය 2025 වර්ෂයේදී නව අංශයක් ලෙස ස්ථාපනය කරන ලදී. කම්කරු දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ විෂයට අදාළ සියලු කටයුතු ඒකාබද්ධ කර විධිමත්ව පවත්වාගෙන යාම සහ

දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණ ක්‍රියාවලියට අදාළ කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

1.4.2.5 කාර්මික සම්බන්ධතා අංශය

සේවක අයිතීන් ආරක්ෂා කරමින් කාර්මික සාමය තහවුරු කිරීම සහ ආර්ථික ඵලදායීතාව නංවාලීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. කම්කරු අණපනත් වලින් නියමකර ඇති සේවා කොන්දේසි හා සේවා තත්ත්වයන් ආරක්ෂා කිරීම, සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම හා ප්‍රවර්ධනය කිරීම, වැඩ වර්ජන හා කාර්මික ආරාවුල් අවම කිරීම, සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම සහ ත්‍රිපාර්ශ්වීය සමිති ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

මේ සඳහා කාර්මික සම්බන්ධතා අංශය යටතේ සේවය අවසන් කිරීමේ අංශය, ත්‍රිපාර්ශ්වීය සමිති අංශය සහ සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධන අංශය ක්‍රියාත්මක වන අතර කාර්මික අධිකරණයේ සම්බන්ධීකරණ කටයුතු ද සිදු කරනු ලබයි.

1.4.2.6 විශේෂ විමර්ශන අංශය

කම්කරු කාර්යාලයක විභාග කරනු ලැබූ හෝ විභාග කරමින් පවතින පැමිණිල්ලක් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝගය ප්‍රකාරව නැවත විමර්ශනය කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

1.4.2.7 නීති ක්‍රියා අංශය

කම්කරු නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සහ නඩු මෙහෙයවීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ. කම්කරු නීති සංශෝධන සම්බන්ධීකරණය කිරීම සහ සියලු කාර්යාලවල නෛතික ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම මෙම අංශය මගින් ඉටු කරයි. කම්කරු නීති සංශෝධනයට අදාළ කටයුතුවලදී කම්කරු දෙපාර්තමේන්තුව වෙතින් ලබා දිය යුතු සහය ලබා දීමද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

1.4.2.8 ශ්‍රම ප්‍රමිති අංශය

පෞද්ගලික අංශයේ සේවකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුබසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ.

1.4.2.9 කාන්තා හා ළමා කටයුතු අංශය

ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් මුළුමනින්ම තුරන් කිරීම සහ වැඩ බිමෙහි කාන්තා දායකත්වය සුරක්ෂිත කිරීම මෙම අංශයේ මූලික වගකීම වේ. ඒ අනුව, වැඩ බිමෙහි කාන්තාවන් ආවරණය වන කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය සහිතව ළමා ශ්‍රමය තුරන් කිරීම සහ

කාන්තාවන්ට හා ළමුන්ට අදාළ කම්කරු නීති රීති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම මෙම අංශය විසින් ඉටු කරනු ලබයි. එසේම, ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය යන මට්ටම් වලින් පවත්වනු ලබන ළමා සංවර්ධන කමිටු වලදී සඵල දායකත්වයක් ලබා දීමද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

1.4.2.10 පාලන අංශය

පාලන අංශය ශාඛා 03කින් සමන්විත වේ. පාලන ශාඛාව, ආයතන ශාඛාව, සහ පුස්තකාලය එම ශාඛා වේ.

පාලන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව ඉඩම් අවශ්‍යතා හඳුනා ගැනීම, ඉඩම් අත්පත් කර ගැනීම, අවශ්‍යතාවය පරිදි ගොඩනැගිලි කුලියට ලබා ගැනීම, දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය, නිලධාරීන්ගේ අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම ආදිය සම්බන්ධයෙන් කටයුතු සිදු කරනු ලබයි.

ආයතන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, බඳවා ගැනීම, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්යසාධනය ඇගයීම්, වැටුප් වර්ධක ලබා දීම්, ස්ථාන මාරු කිරීම්, විශ්‍රාම ගැන්වීම්, නිවාඩු කටයුතු, කාර්ය මණ්ඩලයේ විනය කටයුතු ආදී කාර්ය මණ්ඩලයේ විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණ පනත්, පොත්පත් හා ප්‍රකාශන එකතුවක් පවතින ශ්‍රී ලංකාවේ ප්‍රධානතම පුස්තකාලය කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය වේ. කම්කරු දෙපාර්තමේන්තුවේ, කම්කරු අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහා ද මෙම පුස්තකාලය විසින් පරිශීලන පහසුකම් සලසනු ලබයි.

1.4.2.11 ගොඩනැගිලි නඩත්තු අංශය

පෙර පාලන අංශය යටතේ ඒකකයක් වශයෙන් පැවති ගොඩනැගිලි නඩත්තු ඒකකය 2025 වර්ෂයේදී ප්‍රධාන ඉංජිනේරුවරයෙකු යටතේ වෙනම අංශයක් වශයෙන් ස්ථාපිත කරන ලදී. මෙම අංශය විසින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල ගොඩනැගිලි ඉදිකිරීමට සහ ගොඩනැගිලි නඩත්තු කිරීමට අදාළ සියලු කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබයි. එසේම, ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණ කටයතු සිදු කිරීමද සිදු කරනු ලබයි.

1.4.2.12 මුදල් අංශය

වාර්ෂික අයවැය මඟින් වෙන් කරනු ලබන මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව කාර්යක්ෂමව සහ පිරිමැසුම්දායීව පරිපාලනය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයයි. ඒ අනුව අයවැය ඇස්තමේන්තු

සකස් කිරීම, ප්‍රසම්පාදන සැලසුම ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය කාර්යාල සඳහා අග්‍රිම නිකුත් කිරීම, ගිණුම් වාර්තා සැකසීම සහ දෙපාර්තමේන්තුවේ වත්කම් සමීක්ෂණය හා අපහරණ කටයුතු අදාළ මූල්‍ය රෙගුලාසි ප්‍රකාරව මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

1.4.2.13 සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය

කම්කරු දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික හා ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කිරීම සහ ඒ යටතේ වන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සියලු අංශ හා ප්‍රාදේශීය කාර්යාල සම්බන්ධීකරණය කිරීම, ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම, රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ මඟින් ඉල්ලුම් කරනු ලබන දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය ඇතුලත් දත්ත හා වාර්තා සැපයීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. එසේම, නිලධාරීන්ගේ මානව සම්පත් සංවර්ධනය යටතේ දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සලසා දීම සහ ක්ෂේත්‍ර කටයුතුවලට අවශ්‍ය නීතිමය අණපනත් හා පොදු ආකෘති පත්‍ර මුද්‍රණය කර බෙදාහැරීම ද මෙම අංශය මඟින් ඉටු කරයි.

1.4.2.14 සංඛ්‍යාලේඛන අංශය

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයට අදාළ දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය මඟින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහ අනාගත පුරෝකථනයන්ට අවශ්‍ය පසුබිම සකස් කිරීම මෙම අංශයේ කාර්යභාරයයි. ඒ අනුව, කම්කරු සංඛ්‍යාති වාර්තාව, වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණ, ශ්‍රම ඉල්ලුම සහ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණය, පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය ආදී සමීක්ෂණ අවශ්‍යතාවය අනුව මෙම අංශය මඟින් සිදු කර සමීක්ෂණ වාර්තා ප්‍රකාශයට පත් කරනු ලබයි.

1.4.2.15 අභ්‍යන්තර විගණන අංශය

දෙපාර්තමේන්තුවේ සියලුම මූල්‍ය හා පරිපාලන ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි හා රජයේ චක්‍රලේඛවලට අනුකූලව සිදු වන්නේ දැයි විධිමත් පරිදි අධීක්ෂණය කිරීම මෙම අංශයේ වගකීමයි. කම්කරු කොමසාරිස් ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය, ආයතනික සම්පත්වල උපරිම උපයෝගීතාවය තහවුරු කරමින් මනා විනිවිදභාවයකින් යුතුව දෙපාර්තමේන්තු කටයුතු මෙහෙයවීමට සහාය වේ.

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මඟින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇති අතර එම අරමුදලෙහි කළමනාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් සිදු කරනු ලබයි.

දෙවන පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය හා ඉදිරි දැක්ම


2025 වර්ෂය ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළේ කැපී පෙනෙන ප්‍රගතියක් සනිටුහන් කළ වසරක් වූ අතර, එය දේශීය ආර්ථිකයේ ස්ථාවරත්වයට ශක්තිමත් පදනමක් සැපයීය. විශේෂයෙන්ම ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 2024 වසරේ පැවති 47.4% සිට 2025 දෙවන කාර්තුව වන විට 49.3% දක්වාත්, කාන්තා ශ්‍රම සහභාගිත්වය 29.8% සිට 31.7% දක්වාත් වර්ධනය වෙමින් සමස්ත සේවා නියුක්තිය මිලියන 8.3 ක මට්ටමකට ළඟා විය. මෙම සාධනීය වෙනස්කම් හමුවේ කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සුවිශේෂී වූ අතර, ආයතනික දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීම උදෙසා 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කළ වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

2.1. සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ ක්‍රමික වර්ධනයත් සමඟ සේවක ප්‍රජාව සඳහා සේවාස්ථානයන්හි සුරක්ෂිතතාව තහවුරු කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වේ. ඒ අනුව, කර්මාන්තශාලාවන්හි සේවයේ යෙදෙන ශ්‍රමිකයන් හට සිදුවිය හැකි අනතුරු අවම කිරීම සහ ඔවුන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික වගකීමක් වේ. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂය තුළ සුවිශේෂී ප්‍රගතියක් අත්පත් කරගන්නා ලදී.

කර්මාන්තශාලා ආඥා පනතේ නෛතික අවශ්‍යතාවයන්ට අනුව සහ 2019 අංක 01 දරන කර්මාන්තශාලා (කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමේ සහ කර්මාන්තශාලා ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබා දීමේ) නියෝග අනුව, මෙරට ස්ථාපිත සියලුම කර්මාන්තශාලා කම්කරු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි විය යුතුය. ඒ අනුව, 2025 වර්ෂය තුළදී කර්මාන්තශාලා 2,339ක් ලියාපදිංචි කිරීම සිදු කරන ලද අතර, එය පසුගිය වර්ෂ පහ තුළදී වර්ෂයක් තුළ ලියාපදිංචි කරන ලද වැඩිම කර්මාන්තශාලා සංඛ්‍යාව වේ. 2025.12.31 දිනට මෙරට සමස්ත ලියාපදිංචි කර්මාන්තශාලා සංඛ්‍යාව 8,953ක් දක්වා වර්ධනය වී ඇත. පසුගිය වර්ෂ පහ තුළදී කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කෙරෙන අතර එම ප්‍රගතිය පහත ප්‍රස්ථාරය පරිදි වේ.


ප්‍රස්තාරය 2.1 - 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව



කර්මාන්ශාලා ලියාපදිංචි කිරීමේ කටයුතු තව දුරටත් කාර්යක්ෂම කිරීම සඳහා, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල වෙත අනුයුක්ත වීමට කැමති දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් වෙත 2025 වර්ෂයේදී වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය පිළිබඳ පුහුණුවක් ලබා දී එම නිලධාරීන් අනුයුක්ත කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, ඉදිරි වර්ෂයන්හිදී කර්මාන්ශාලා ලියාපදිංචි කිරීමේ කටයුතු තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.


තර්මාන්තශාලා සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට පෙර එහි වාතාශ්‍රය, ආලෝකය, ගිනි ආරක්ෂණ විධිවිධාන, හදිසි පිටවීම් සහ සේවකයන් සඳහා අවශ්‍ය පහසුකම් යනාදිය පනතට අනුකූලදැයි කම්කරු දෙපාර්තමේන්තුව වෙතින් පූර්ව පරීක්ෂාවක් සිදු කර ගැනීම සඳහා කර්මාන්තශාලා හිමියන් විසින් ගොඩනැගිලි පිඹුරුපත් අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව, 2025 වර්ෂයේදී කර්මාන්තශාලා ගොඩනැගිලි පිඹුරුපත් 204 ක් පරීක්ෂා කර අනුමත කරන ලදී. පසුගිය වර්ෂ පහ තුළදී එම කටයුතු වල තොරතුරු පහත ප්‍රස්ථාරය පරිදි වේ.

ප්‍රස්තාරය 2.2 - 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂිකව පරීක්ෂා කර අනුමත කරන ලද කර්මාන්තශාලා ගොඩනැගිලි පිඹුරුපත් සංඛ්‍යාව



එසේම, කර්මාන්තශාලා ආඥා පනතට අනුකූලව කර්මාන්තශාලා පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කර බලා අනතුරු ඇතිවීමේ තත්ත්ව පවතී නම් ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් විසින් අඛණ්ඩව සිදු කරනු ලැබේ. 2025 වර්ෂයේ දී එසේ පරීක්ෂා කර බලා උපදෙස් දෙනු ලැබූ කර්මාන්තශාලා සංඛ්‍යාව 2613 කි. එසේම, කර්මාන්තශාලා පනතේ විධිවිධාන උල්ලංඝනය කරන ලද ආයතනවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම අඛණ්ඩව සිදු කළ අතර, 2025 වසර තුළ එවන් අවස්ථා 03ක් සම්බන්ධයෙන් නඩු පැවරීම සිදු කරන ලදී.

ප්‍රස්තාරය 2.3 - 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂිකව පරීක්ෂා කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව




කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් විසින් සිදු කරනු ලබන කර්මාන්ශාලා පරීක්ෂණ වලට අතිරේකව කම්කරු දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරීන් විසින්ද කර්මාන්තශාලා පරීක්ෂා කර බලා කර්මාන්ශාලාවන්හි ආලෝක මට්ටම, ශබ්ද මට්ටම ආදී පාරිසරික මිනුම් ලබා ගැනීමත් කර්මාන්ත ශාලාවන්හි ගෘහ කළමනාකරණය, සේවකයන්හට ලබා දෙන සුභසාධන පහසුකම් ආදිය පිළිබඳව වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් සිදු කිරීමත් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2025 වර්ෂයේදී කර්මාන්තශාලා 312 ක සහ වාහන සේවා ස්ථානයන් 14ක පාරිසරික මිනුම් ලබා ගැනීම සිදු කරන ලද අතර එමගින් ප්‍රතිලාභ ලද සේවකයන් සංඛ්‍යාව 27,727 කි. මෙසේ පාරිසරික මිනුම් සිදු කරන ලද කර්මාන්තශාලා ඇතුළු කර්මාන්තශාලා 324 ක සහ වාහන සේවා ස්ථානයන් 14හි වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන්ද සිදු කරන ලදී. මෙහිදී පරීක්ෂණ සිදු කළ කර්මාන්ත ශාලාවල වැඩ පරිසරය හිතකර තත්ත්වයකට ගෙන ඒම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීමට කටයුතු කර ඇත. එසේම, නිශ්චිත කාලපරිච්ඡේදයකට පසු මෙම කර්මාන්ත ශාලාවල වැඩ පරිසරික තත්ත්වය හා සේවකයන්හට තවදුරටත් ඒ ආශ්‍රිතව ඇති ගැටළු සම්බන්ධයෙන් උපදේශනය හා පසු විපරම සිදු කිරීමට නියමිතය.

කර්මාන්තශාලා සේවකයින්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යයට සම්බන්ධයෙන් ලැබී තිබූ පැමිණිලි 126 ක් සම්බන්ධයෙන් 2025 වර්ෂය තුළදී විමර්ෂණ කටයුතු සිදු කළ යුතුව තිබුණි. එයින් පැමිණිලි 63 ක් සඳහා සේවකයින් වන්දි ලබා ගැනීම සඳහා යොමු කරන ලද අතර පැමිණිලි 57ක් සම්බන්ධයෙන් කර්මාන්තශාලාහිමියන් වෙත නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව, පැමිණිලි 120ක් සම්බන්ධයෙන් වර්ෂය තුළදී විමර්ෂණ කටයුතු සිදු කර සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට කටයුතු කර ඇති අතර ඉතිරි පැමිණිලි 06 හි විමර්ෂණ කටයුතු තව දුරටත් සිදු කරමින් පැවතුණි.

2025 වර්ෂය තුළ සේවාස්ථානයන්හි මරණීය සහ මරණීය නොවන අනතුරු සිදු වීමේ සාපේක්ෂ අඩුවීමක් දක්නට ලැබෙන අතර, එය සේවාස්ථාන සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ලබා ඇති සුවිශේෂී ප්‍රගතියකි. විශේෂයෙන්ම, පසුගිය වසර පහක කාලසීමාව සැසඳීමේදී අවම මරණීය අනතුරු සංඛ්‍යාව වන 46 වාර්තා වී ඇත්තේ 2025 වර්ෂයේදී වීම කැපී පෙනෙන කරුණකි. පසුගිය වසර තුනක කාලය පුරා මරණීය අනතුරු සිදුවීම ක්‍රමිකව පහළ යාම ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන ඉතා සාධනීය ප්‍රවණතාවයකි.

ප්‍රස්තාරය 2.4 - 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්තා වී විමර්ශන කටයුතු සිදු කරන ලද අනතුරු සංඛ්‍යාව




එසේම, ඉහත ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි 2025 වර්ෂයේදී වාර්තා වූ මරණීය නොවන අනතුරු සංඛ්‍යාව 1,371 ක් වන අතර, එය 2023 සහ 2024 වර්ෂයන්ට සාපේක්ෂව සැලකිය යුතු අඩු වීමකි. දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කළ විධිමත් පරීක්ෂණ, දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු පිහිටුවීමේ වැඩසටහන හරහා මෙම අනතුරු අවම කරගැනීමට හැකි වී තිබේ.

වර්ෂ කිහිපයකට පෙර ආරම්භ කර අඛණ්ඩව සිදු කරන ලද ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු පිහිටුවීමේ වැඩසටහන 2025 වර්ෂයේදී ද සාර්ථකව සිදු කරන ලදී. සේව්‍ය සේවක දෙපාර්ශවයේම

සාමාජිකත්වයෙන් ආයතන මට්ටමින් පිහිටවනු ලබන මෙම සුරක්ෂිතතා කමිටු මගින් සිය සේවාස්ථානයන්හි අනතුරු සහ වෘත්තීය රෝගාබාධ ඇති විය හැකි තත්වයන් කල්තබා හඳුනාගැනීමටත් ඒවා සඳහා පිළියම් යෙදීමටත් අවස්ථාව සැලසේ. 2025 වර්ෂයේ පිහිටවනු ලැබූ සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාව 78කි. ඒ අනුව, 2025.12.31 දිනට ක්‍රියාත්මක මුළු ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාව 955 කි.

කර්මාන්තශාලා ආඥා පනත සහ එහි රෙගුලාසි යටතේ පරීක්ෂාවට භාජනය කර කාලීනව පරීක්ෂණ වාර්තා ලබා ගත යුතු කර්මාන්තශාලාවල භාවිතා කරනු ලබන යන්ත්‍ර සහ උපකරණ සේව්‍යයන්ගේ ඉල්ලීම අනුව පරීක්ෂා කර බලා කම්කරු දෙපාර්තමේන්තුව වෙත පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම කම්කරු දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර බලයලත් නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2025 වර්ෂයේදී එසේ බලයලත් නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කර ඇති අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව 11,809 කි.

ප්‍රස්තාරය 2.5 - 2025 වර්ෂයේදී බලයලත් නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලැබූ අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා සංඛ්‍යාවේ වර්ගීකරණය




එසේම, දැනුවත් කිරීම් සහ වෘත්තීය සුරක්ෂිතතා සංස්කෘතියක් ඇති කිරීම සේවා ස්ථානවල සුරක්ෂිතතා සංස්කෘතියක් නිර්මාණය කිරීම වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද අතර ලෝක සුරක්ෂිතතා දිනයට සමගාමීව වැඩසටහන් මාලාවක් ද පවත්වන ලදී. මෙම වැඩසටහන් පිළිබඳ වැඩිදුර විස්තර 2.7 පරිච්ඡේදයෙහි සඳහන් වේ.

2.2. සේවකයන්ගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාවගේ සමාජ ආරක්ෂණය උදෙසා පවතින ප්‍රධානතම අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල විසින් 2025 වර්ෂය තුළ සුවිශේෂී මූල්‍යමය හා ව්‍යුහාත්මක වර්ධනයක් සනිටුහන් කරන ලදී. 2025 වර්ෂය අවසානය වන විට අරමුදල සතු සක්‍රිය සාමාජික සංඛ්‍යාව මිලියන 2.9 ක් දක්වා ප්‍රසාරණය වූ අතර, ලියාපදිංචි සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව 92,000 ක සීමාව ඉක්මවා ගියේය. මෙම වර්ධනයේ වඩාත් කැපී පෙනෙන ලක්ෂණය වූයේ 2025 වර්ෂය අවසානය වන විට අරමුදලේ සමස්ත වටිනාකම රුපියල් ට්‍රිලියන 5 ක දැවැන්ත කඩඉම කරා ළඟා වෙමින් දේශීය ආර්ථිකයේ ප්‍රධානතම සමාජ ආරක්ෂණ යාන්ත්‍රණය ලෙස තම භූමිකාව තවදුරටත් තහවුරු කර ගැනීම වේ.

ප්‍රස්තාරය 2.6 - 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලෙහි වර්ධනය



2.2.1 සේවක අර්ථසාධක අරමුදල යටතේ සාමාජිකයින් සහ සේවායෝජකයින් ලියාපදිංචි කිරීම



රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ඩිජිටල් රාජ්‍යාකරණයක් උදෙසා සේවක අර්ථසාධක අරමුදල මගින් ලබා දෙනු ලබන සේවාවන් විද්‍යුත් සේවාවන් වශයෙන් ලබා දීමේ කටයුතු වල ප්‍රථම පියවර 2025 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඒ අනුව, සේවක

අර්ථසාධක අරමුදල සඳහා සේවායෝජකයන් සහ සාමාජිකයන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි කිරීමේ Digital EPF මෘදුකාංගය හඳුන්වාදීමේ කටයුතු ගරු කම්කරු අමාත්‍යතුමාගේ සහ ගරු කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2025.12.29 දින ආරම්භ කරන ලදී. මෙමඟින් කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යාල වෙත පැමිණීමෙන් තොරව අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය මඟින් යොමු කර අදාළ ලියාපදිංචි කටයුතු සිදු කර ගැනීමේ පහසුකම සේවාලාභීන් වෙත හිමිවේ. 2025 වර්ෂයේ දී නව ආයතන 10,611ක් සේවක අර්ථසාධක අරමුදල වෙත ලියාපදිංචි වී ඇත.

2.2.2 ඒකාබද්ධ දත්ත පද්ධති සකස් කිරීම සහ ගොනු විද්‍යුත් ක්‍රමයට ගබඩා කර තැබීම


ශ්‍රී ලංකා මහ බැංකුව සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදලට අදාළ ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා දත්ත පද්ධති දෙකක් භාවිතා කිරීම හේතුවෙන් උද්ගත වී ඇති දුෂ්කරතාවයන් සඳහා තිරසර විසඳුමක් වශයෙන් ඒකාබද්ධ දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා එකඟතාවයට එළඹෙන ලදී. ඒ අනුව, 2025 වර්ෂයේදී ඒකාබද්ධ දත්ත පද්ධතියක් සකස් කිරීමේ කාර්යය සඳහා උපදේශකවරයෙකුගේ සේවාව ලබා ගැනීමට කටයුතු කරන ලදී. අතර ඔහුගේ නිර්දේශ අනුව පද්ධතිය සකස් කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමේ කටයුතු ආරම්භ කරන ලද අතර එහි ඉදිරි ක්‍රියාකාරකම් 2026 වර්ෂයේදී සිදු කිරීමට නියමිතය.

එමෙන්ම, සේවක අර්ථසාධක අරමුදලට අදාල ගොනු විද්‍යුත් ක්‍රමයට ගබඩා කර තැබීම සඳහා ගොනු ස්කෑන් කිරීමේ අවශ්‍යතාවය මෙන්ම විද්‍යුත් ලේඛනාගාරයක අවශ්‍යතාවය ද හඳුනාගන්නා ලදී. ඒ අනුව, ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු 2026 වර්ෂයේදී ආරම්භ කිරීමට අපේක්ෂිතය.


2.2.3 සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම

සේවා නියුක්තිය අවසන් වන අවස්ථාවන්හිදී අදාළ අනෙකුත් අවස්ථාවන්හිදී සහ සේවක අර්ථසාධක අරදමුදලේ සාමාජිකයන් විසින් ඉල්ලුම් කරනු ලබන අවස්ථාවන්හිදී එම ඉල්ලීම් කම්කරු දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ගෙවීම් කටයුතු කිරීමේ ඉදිරි කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරනු ලැබේ. 2025 වර්ෂයේ දී සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ඉල්ලුම්කරන ලද සාමජිකයන් වෙත ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි 143,696 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කර ඇත. ලැබී ඇති ප්‍රතිලාභ අයදුම්පත්‍ර සංඛ්‍යාව අඩු බැවින් 2024 සහ 2025 වර්ෂයන්හිදී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරන ලද තීරණ ලිපි සංඛ්‍යාවද අඩු වී ඇත.


ප්‍රස්තාරය 2.7 - 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාවේ වර්ගීකරණය



ප්‍රස්තාරය 2.8 - 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාව



ප්‍රස්තාරය 2.9 - සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවීම සඳහා ගතවූ කාලය - 2025.01.01.සිට 2025.12.31




2025 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු වල කාර්යක්ෂමතාවය පහත ප්‍රස්ථාරය පරිදි වේ. ඒ අනුව, සති 2 කට වඩා අඩු කාලසීමාවකදී අයදුම්පත් වලින් 76% කට වැඩි ප්‍රමාණයක් සඳහා තීරණ ලිපි යැවීම සිදු කර ඇත.

2.2.4 දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට අදාලව නිවේදන යැවීම

දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් එම මුදල් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම නිවේදන හා අවසන් නිවේදන යොමු කරන අතර, ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ. ඒ අනුව 2025 වර්ෂයේදී පළමු නිවේදන 19,603 ක් යොමු කර ඇති අතර එම පළමු නිවේදන මඟින් වර්ෂය තුළ අයකර ගෙන ඇති මුදල රුපියල් මිලියන 1,756 ක් වේ. එසේම, අවසන් නිවේදන 10,144 ක් යොමු කර ඇති අතර අවසන් නිවේදන මඟින් රුපියල් මිලියන 6,445 ක් අයකර ගෙන ඇත.

ප්‍රස්තාරය 2.10 - 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට අදාලව නිවේදන යැවූ සංඛ්‍යාව



2.3. කාර්මික සාමය සුරක්ෂිත කිරීම

2.3.1 සමාජ කතිකාව ප්‍රවර්ධනය තුළින් සේවා සේවක සබඳතා ශක්තිමත් කිරීම

පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ ආයතන තුළ කාර්මික සාමය තහවුරු කෙරෙන සුහදශීලී වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා සේවා සේවක දෙපාර්ශවය අතර ශක්තිමත් සමාජ කතිකාවතක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

එමෙන්ම, පාර්ශවකරුවන්ගේ මැදිහත්වීම් මඟින් කාර්මික ආරවුල් හා ගැටළු ප්‍රජාතන්ත්‍රවාදීව විසඳීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත වැඩිදුරටත් පවරා ඇත. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් සේවා සේවක දෙපාර්ශවය සඳහාම සමාජ කතිකාව, වැඩපොළ සහයෝගිතාවය සහ කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීමේ ආයතනික මට්ටමේ වැඩසටහන් මාලාවක් 2025 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, එම වර්ෂය තුළ පැවැත්වූ වැඩසටහන් 240ක් තුළින් සේවකයන් 9552 ක් හා සේවායන් 411ක් වශයෙන් මුළු ප්‍රතිලාභීන් 9963 ක පිරිසක් දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු 2.7 පරිච්ඡේදයෙහි සඳහන් කර ඇත.

2.3.2 කලාප සහ දිස්ත්‍රික් උපදේශන සභා පැවැත්වීම

රජය, සේවා සහ සේවක සංවිධාන අතර සමාජ කතිකාව වඩාත් සක්‍රීයව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, ජාතික කම්කරු උපදේශන සභාවේ ප්‍රාදේශීය මට්ටමේ ව්‍යුහයක් ලෙස කලාප උපදේශන සභා 11 ක් සහ දිස්ත්‍රික් උපදේශන සභා 40 ක් ද 2025 වර්ෂය තුළ සාර්ථකව පවත්වන ලදී. මෙම උපදේශන සභා සඳහා පාර්ශවකරුවන් 1,959 දෙනෙකු සක්‍රීයව දායකත්වය ලබා දීම සුවිශේෂී වේ. මෙම උපදේශන සභා මගින් ඉදිරිපත් වූ ජාතික මට්ටමින් අවධානය යොමුකළ යුතු කරුණු පවතී නම් එම කරුණු ජාතික කම්කරු උපදේශන සභාව (NLAC) වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2.3.3 පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් දීපව්‍යාප්ත මට්ටමින් වඩාත් ඵලදායී ලෙස ව්‍යාප්ත කිරීමේ අරමුණින්, ප්‍රාදේශීය කම්කරු කාර්යාල නිලධාරීන් පුහුණු කිරීමේ අවශ්‍යතාව හඳුනා ගන්නා ලදී. සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගිතාව පිළිබඳ විෂය දැනුම වර්ධනය කිරීමට අමතරව, නිලධාරීන්ගේ ඉදිරිපත් කිරීමේ කුසලතා (Presentation Skills) ඇතුළු මෘදු කුසලතා (Soft Skills) වර්ධනය කිරීම මෙම වැඩසටහන් මාලාවේ ප්‍රධාන ඉලක්කය විය. ඒ අනුව, සුදුසු නිලධාරීන් තෝරා ගනිමින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ (Training of Trainers) වැඩසටහන් අදියර දෙකකින් 2025 වර්ෂයේදී සාර්ථකව සිදු කරන ලදී. මෙම ක්‍රියාවලිය හරහා පුහුණුකරුවන් ලෙස කටයුතු කළ හැකි නිලධාරීන් 56 දෙනෙකුගෙන් සමන්විත පුහුණුකරුවන් සංචිතයක් ගොඩනැගීමට දෙපාර්තමේන්තුවට හැකි විය. 2026 වර්ෂයේ සිට මෙම පුහුණුකරුවන්ගේ සම්පත් දායකත්වය උපයෝගී කරගනිමින්, ප්‍රාදේශීය මට්ටමින් ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පැවැත්වීමට සැලසුම් කර ඇත.

2.3.4 සාමූහික ගිවිසුම්

සාමූහික ගිවිසුම් හරහා සේවකයන්ට පවතින කම්කරු නීතිමය ප්‍රතිපාදනවලට වැඩිමනක් වරප්‍රසාද සහ අයිතිවාසිකම් හිමිවන අතරම, සේවායෝජකයන්ට සිය ආයතනික ඉලක්ක සපුරා ගැනීම සඳහා ඵලදායී සේවා දායකත්වයක් ලබා ගැනීමට අවශ්‍ය කොන්දේසි සම්පාදනය කර ගැනීමට ද අවස්ථාව සැලසේ. සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම මඟින් දෙපාර්ශවයම මෙවැනි සාමූහික එකඟතාවන් වෙත යොමු කිරීම දෙපාර්තමේන්තුවේ මූලික අභිලාෂයකි. ඒ අනුව, 2025.01.01 දින සිට 2025.12.31 දක්වා වූ කාලසීමාව තුළ අලුතින් ගැසට් කරන ලද සාමූහික ගිවිසුම සහ කාලය දීර්ඝ කරන ලද ගිවිසුම් 28 ඇතුළුව, 2025.12.31 දින වන විට ක්‍රියාත්මකව පවතින මුළු සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 226කි.

2.3.5 ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

සේවායෝජකයන් විසින් සේවකයන් සේවයේ නියුක්ත කරවීමේ නීති නිසි පරිදි අනුගමනය කරනු ලබන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා 2025 වර්ෂයේදී සිදු කරනු ලැබූ ක්ෂේත්‍ර පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.



දිස්ත්‍රික් සහ උප කම්කරු කාර්යාලයන්ට අනුයුක්ත කම්කරු නිලධාරීන් විසින් සිදු කරන ලද ශ්‍රමික පරීක්ෂණ සංඛ්‍යාව	93,153
කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ පරීක්ෂණ සංඛ්‍යාව	24
ළමුන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි සඳහා සිදු කරනු ලැබූ පරීක්ෂණ සංඛ්‍යාව	77
ධීවර හා වතු ක්ෂේත්‍රයන්හි පවතින ළමා ශ්‍රමයට අවධානම් දරුවන් හඳුනාගැනීම සඳහා ඉලක්ක කරගත් අවධානම් ප්‍රදේශයන්හි විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණ සංඛ්‍යාව	35
නිවාසගත (Home Stay) සහ සත්කාරක සේවා මධ්‍යස්ථාන (Hospitality Service Centers) ද ඇතුලත් වන ආකාරයට සංචාරක ක්ෂේත්‍රය ආවරණය වන පරිදි විශේෂ කණ්ඩායම් පරීක්ෂණ සංඛ්‍යාව	75
වෘත්තීය ආරක්ෂා ව හා සෞඛ්‍යය සම්බන්ධ පරීක්ෂණ සංඛ්‍යාව	2,953
විශේෂ විමර්ෂන අංශය විසින් සිදු කරන ලද විශේෂ පරීක්ෂණ සංඛ්‍යාව	33
එකතුව	**96,350**

2.3.6 ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරාවුල් නිරවුල් කිරීම

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් සහ උප කම්කරු කාර්යාල වෙත 2025 වර්ෂය තුළ ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව 16,934 කි. එයින් පැමිණිලි 10,696 ක් වර්ෂය තුළ විසඳීමට කටයුතු කරන ලදී. කම්කරු දෙපාර්තමේන්තුව වෙත මාර්ගගත ක්‍රමය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමේ පහසුකම (Complaint Management System) 2025 වර්ෂයේදී තවදුරටත් සංවර්ධනය කරන ලදී. එ අනුව, වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා නව මොඩියුලයක් 2025 වර්ෂයේදී පද්ධතියට එක් කරන ලදී. මීට අමතරව, නඩු කටයුතු පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමේ මොඩියුලය ද සංවර්ධනය කරමින් පවතී. සේවාලාභී අවශ්‍යතා මත පදනම්ව මෙම පද්ධතිය ඉදිරියේදී තවදුරටත් සංවර්ධනය කිරීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

2.3.7 බේරුම්කරණ කටයුතු සිදු කිරීම

ප්‍රාදේශීය කාර්යාල මඟින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මඟින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූ කාර්මික ආරාවුල්, බේරුම්කරණය හෝ කාර්මික අධිකරණයක් වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාල සීමාව තුළදී බේරුම්කරණය සඳහා යොමු කරනු ලැබූ ආරාවුල් 81 ද ඇතුලත්ව ආරාවුල් 216 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට නියමිතව

තිබුණි. ඒ අතුරින් ආරාවුල් 103 ක පරීක්ෂණ කටයුතු අවසන් කර ප්‍රදාන 80 ක් ලබා දී ඇති අතර ප්‍රදාන 23 ක් ඉදිරියේදී ලබා දීමට නියමිතව ඇත.

ඒ අනුව, 2025.12.31 දින වන විට ආරාවුල් 113 ක් බෙරුම්කරණයේ විභාග වෙමින් පැවතුණි.

2.3.8 වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම

වෘත්තීය සමිති ආඥා පනතේ ප්‍රතිපාදනවලට අනුව, මෙරට ක්‍රියාත්මක වන සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි. ඒ අනුව, 2025.01.01 සිට 2025.12.31 දක්වා දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 99 කි. එම කාලය තුළදී වෘත්තීය සමිති 153 ක් අවලංගු කර ඇත. ඒ අනුව, 2025.12.31 දිනට වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2,088 කි.

2.3.9 වැඩ වර්ජන විසඳීම සඳහා අදාළ මැදිහත්වීම් සිදු කිරීම

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය වීම වැළැක්වීමට දෙපාර්තමේන්තුව පූර්ව මැදිහත්වීම් සිදු කරන අතර, එවැනි තත්ත්වයක් ඇති වූ වහාම සාකච්ඡා මාර්ගයෙන් එම ආරවුල් නිරවුල් කිරීමට කටයුතු කරයි. ඒ අනුව, 2025 වර්ෂය තුළ වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව 19 ක් වන අතර ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ක්ෂේත්‍රය	වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව	සහභාගී වූ සේවක සංඛ්‍යාව	අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව
වතු	06	410	1,191
ඉදිකිරීම්	03	420	2,206
නිෂ්පාදන	10	4,879	11,294
එකතුව	19	**5,709**	**14,691**

2.3.10 කර්මාන්තශාලාවල රැකියා අහිමි වූ සේවකයින්ට වන්දි ලබා දීම

1978 වර්ෂයේදී වැඩ වර්ජනය හේතුවෙන් ජාතික පේෂකර්ම සංස්ථාවට අයත්ව තිබූ තුල්භිරිය සහ පූගොඩ පේෂකර්මාන්ත ශාලාවල සේවය අහිමි වූ සේවකයින්ට වන්දි ලබා දීම 2025 වර්ෂයේදී සිදු කරන ලදී. 2024.08.22 දිනැති සහ 2025.06.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව රැකියා අහිමි වූ සේවකයින් 1717 ක් සඳහා වන්දි ගෙවීමට අනුමැතිය ලැබී තිබුණි. එයින් සේවකයින් 1659 දෙනෙකු සඳහා රුපියල් 82,991,475.00 ක වන්දි මුදලක් ගෙවීමට කටයුතු කරන ලදී. සේවකයින් විදේශ ගතව සිටීම ආදී කරුණු හේතුවෙන් සේවකයන් 08 දෙනෙකුගේ වන්දි මුදල් 2025.12.31 දින වන විට ශේෂව පැවතිණි. සේවකයා සහ කලත්‍රයා යන දෙදෙනාම මිය යාම හෝ සේවකයා අවිවාහකව මිය යාම හේතුවෙන් සේවකයින් 50 දෙනෙකුගේ වන්දි මුදල් ගෙවීමට හැකියාවක් නොමැතිව ශේෂ විය. ඒ අනුව, අයදුම් පත්‍ර ඉදිරිපත් කරන ලෙස පළකරන ලද පුවත්පත් දැන්වීමට ප්‍රතිචාර වශයෙන් පළමු

1717 දෙනා අතරට ඇතුලත් නොවූ සේවකයන් හෝ සේවකයන්ගේ කලත්‍රයන් විසින් වන්දි ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර 169ක් ලැබී තිබූ අතර 2025.12.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඔවුන් සඳහා වන්දි ගෙවීමට මෙම ශේෂ ව පැවති වන්දි මුදල් සහ අතිරේක ප්‍රතිපාදන යොදා ගැනීමට අනුමැතිය හිමි විය. ඒ අනුව, එම සේවකයන් සහ කලත්‍රයන් සඳහා වන්දි 2025 වර්ෂයේදී ගෙවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

මීට අතිරේකව මත්තේගම සීමාසහිත කාබුල් ලේස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වසා දැමීම හේතුවෙන් රැකියා අහිමි වූ සේවකයින් අතුරින් මෙතෙක් වන්දි ලබා නොතිබූ සේවකයින් සඳහා වන්දි ලබා දීමට අදාළ මූලික කටයුතුද 2025 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

2025.09.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව "රාජ්‍ය ව්‍යාපාර විසින් නිරවුල් කළ යුතුව ඇති හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් හා එම ආයතන විසින් ගෙවිය යුතු හිඟ බදු සඳහා වන බැඳීම් හඳුනා ගැනීම සහ එකී ගෙවීම් එකවර හෝ අදියරගතව නිරවුල් කිරීම සම්බන්ධ කමිටු වාර්තාවේ" නිර්දේශ සම්බන්ධයෙන් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, පහත ආයතනයන්හි 2025.04.30 දිනට නිරවුල් කළ යුතුව ඇති සේවක අර්ථසාධක අරමුදල් සහ පාරිතෝෂික ගෙවීම 2026 වර්ෂයේදී සිදු කිරීම සඳහා රුපියල් බිලියන 5 ක ප්‍රතිපාදන මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට නියමිතය.

1. සී/ ස ලංකා සීනි (පුද්ගලික) සමාගම
2. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
3. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
4. ලංකා ධීවර සංස්ථාව
5. සී/ස ඇල්කඩුව වැවිලි සමාගම
6. නෝර්ත් සී සමාගම
7. ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය





ඡායාරූපය - **2.1 තුල්හිරිය සහ පූගොඩ පේෂකර්මාන්ත ශාලාවල සේවය අහිමි වූ සේවකයින්ට වන්දි ලබා දීමේ සංකේතාත්මක වැඩසටහන - 2025.05.30**

2.4. සේවකයන්ගේ නෛතික රැකවරණය

සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, එම නීති උල්ලංඝනය කරන සේවායෝජකයන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත්, ඒ තුළින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

2.4.1 කම්කරු නීති සංශෝධනය කිරීම

- **යෝජිත සේවා නියුක්ති පනත සමාලෝචනය කිරීම**

වර්තමාන වැඩ ලෝකයේ වෙනස්කම්වලට ගැළපෙන පරිදි සේවක අයිතීන් සුරකිමින් ආයෝජන දිරිමත් වන, සරල කම්කරු නීති පද්ධතියක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවයකි. ඒ අනුව, අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ පත්කළ විද්වත් කමිටුවක් මඟින් පවත්නා කම්කරු ආඥා පනත් 14ක් යාවත්කාලීන කිරීමට සහ අවශ්‍ය සංශෝධන සිදු කිරීමට මේ වන විට පියවර ගනිමින් පවතී. මෙම පනතේ සඳහන් කරුණු සමාලෝචනය කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශයට සහය ලබා දීම උදෙසා දෙපාර්තමේන්තුව විසින් කමිටු තුනක් පිහිටුවා සමාලෝචන කටයුතු ආරම්භ කරන ලදී. 2025 වර්ෂයේදී, සේවා තත්ත්ව සහ කොන්දේසි යන ක්ෂේත්‍රයට අදාළ කරුණු දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර කාර්මික සම්බන්ධතා සහ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඉදිරි වර්ෂයේදී සාකච්ඡා සිදු කිරීමට නියමිතය.

- **1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥාපනත යටතේ රෙගුලාසි සම්පාදනය කිරීම සහ සංශෝධනය කිරීම**

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රකාරව හඳුනාගත් වෘත්තීය ආයතන සඳහා කාර්ය ස්වභාවය අනුව සේවක සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම සහ ඒ වෙනුවෙන් ප්‍රමිතීන් සකස් කිරීම සම්බන්ධ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඒ යටතේ, 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත යටතේ සම්පාදනය කළ යුතු රෙගුලාසි 02 ක් හඳුනාගෙන කෙටුම්පත් සකස් කරන ලදී. මෙම කෙටුම්පත් 2026 වර්ෂයේදී ජාතික කම්කරු උපදේශන සභාවට ඉදිරිපත් කර යෝජනා ලබා ගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. උපදේශකවරයෙකුගේ සහය ලබා ගනිමින් තවත් රෙගුලාසි 15ක් 2026 වර්ෂයේදී කෙටුම්පත් කිරීමට අපේක්ෂිතය.


- **1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ පනත සංශෝධනය කිරීම**

නේවාසික හෝටල්වල කාන්තාවන් ආහාරපාන පිළිගන්වන්නියන් ලෙස රාත්‍රී සේවයේ යෙදවීම සඳහා හැකිවන ප්‍රතිපාදන ඇතුළත්ව 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී.

2.4.2 අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම

සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, එම නීති උල්ලංඝනය කරන සේවායෝජකයන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත්, ඒ තුළින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. 2025 වර්ෂයේ පළමු කාර්තු තුන තුළ දෙපාර්තමේන්තුව විසින් මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරය පරිදි වේ.

ප්‍රස්තාරය 2.11 - 2025.01.01 සිට 2025.12.31 දක්වා මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු



අනෙකුත් අධිකරණයන්හි ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ 2025 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

අධිකරණය	2025.01.01 දිනට පැවති නඩු සංඛ්‍යාව	2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා එක් වූ නඩු සංඛ්‍යාව	2025.12.31 දිනට අවසන් වූ නඩු සංඛ්‍යාව	2025.12.31 දිනට ඉතිරි නඩු සංඛ්‍යාව
ශ්‍රේෂ්ඨාධිකරණය	143	34	15	162
අභියාචනාධිකරණය	440	50	77	413
මහාධිකරණය	104	32	26	110
වාණිජ මහාධිකරණය	137	07	03	141


2.5 ශ්‍රම ප්‍රඥිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ වැටුප් හා සේවා කොන්දේසි වර්තමාන ජීවන තත්ත්වයට ගැළපෙන සේ යාවත්කාලීන කිරීම මෙන්ම, එම නීතිමය හිමිකම් නිසි පරිදි ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. ඒ අනුව, 2025 වර්ෂයේදී එම විෂය ක්ෂේත්‍රයට අදාලව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

2.5.1 ජාතික අවම වේතනය සංශෝධනය කිරීම

2025 අංක 11 දරණ සේවකයින්ගේ ජාතික අවම වේතන සංශෝධන පනත මගින් 2025.04.01 දින සිට ජාතික අවම මාසික වේතනය රු. 27,000.00 දක්වා ද දෛනික වේතනය රු. 1,080.00 දක්වා ද ඉහළ නංවන ලදී. එසේම, 2026.01.01 දින සිට ජාතික අවම මාසික වේතනය රු. 30,000.00 දක්වා ද දෛනික වේතනය රු. 1,200.00 දක්වා ද ඉහළ නැංවීමට එම පනත මගින් ප්‍රතිපාදන සකස් කර ඇත.

ප්‍රස්තාරය 2.12 - ජාතික අවම වේතන පනතේ විකාශනය



2.5.2 දින 05 වැඩසටහන සඳහා අනුමැතිය ලබා දීම

දින 05 වැඩසටහන සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා සේවායෝජකයින් වෙතින් 2025 වර්ෂයේදී ඉල්ලීම් 331 ක් ලැබී ඇති අතර එම ඉල්ලීම් වලින් 294ක් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලද අතර අදාළ කොන්දේසි සම්පූර්ණ නොකරන ලද ඉල්ලීම් 37ක් ප්‍රතික්ෂේප කරන ලදී.


2.5.3 පඩි පාලක සභා අඥාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම

පඩි පාලක සභා අඥාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා 2025 වර්ෂයේදී ඉල්ලීම් 229 ක් ලැබී ඇති අතර පසුගිය වර්ෂයේ ලැබී ඉදිරි කටයුතු කරමින් පැවති ඉල්ලීම්ද ඇතුලත්ව ඉල්ලීම් 190ක් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලදී. ඉල්ලීම් 69 ක් ප්‍රතික්ෂේප කරන ලදී.


2.5.4 අණ පනත් සම්බන්ධයෙන් සේවය හා සේවක පාර්ශව විසින් සිදු කරනු ලබන විමසීම් සඳහා පැහැදිලි කිරීම් හා අර්ථ නිරූපණ ලබා දීම

අණ පනත් සම්බන්ධයෙන් සේවය හා සේවක පාර්ශව විසින් 2025 වර්ෂයේදී විමසීම් 226 ක් ඉදිරිපත් කර තිබුණි. එය 2024 වර්ෂයේ ලද විමසීම් 70 ට සාපේක්ෂව කැපී පෙනෙන වැඩි වීමකි. එයින් 212 ක් සඳහා පැහැදිලි කිරීම් හා අර්ථ නිරූපණ ලබා දීමට කටයුතු කරන ලද අතර ඉතිරි විමසීම් සම්බන්ධයෙන් කටයුතු කරමින් පැවතිණි.

ප්‍රස්තාරය 2.13 - 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් ලැබීම සහ අනුමැතිය ලබා දීම



ප්‍රස්තාරය 2.14 - 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා දින 05 වැඩසටහන සඳහා ඉල්ලීම් ලැබීම සහ අනුමැතිය ලබා දීම



2.5.5 පඩිපාලක සහා සම්බන්ධ ක්‍රියාකාරකම්

2025 වර්ෂයේදී කැඳවීම් කර සක්‍රිය තත්ත්වයට පත් කරන ලද පඩිපාලක සභා ලැයිස්තුව පහත පරිදි වේ.

- තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය.
- රබර් වැවීමේ හා දල රබර් සැකසීමේ කර්මාන්තය.
- පොල් වැවීමේ කර්මාන්තය
- ආරක්ෂක සේවා කර්මාන්තය
- පවිත්‍රතා සේවා කර්මාන්තය
- ඇඳුම් සෑදීමේ කර්මාන්තය
- රෙදි පිළි නිෂ්පාදන කර්මාන්තය


2.6 සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා කාන්තා ශ්‍රම බලකායේ සක්‍රීය දායකත්වය ලබාගැනීම සඳහා ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ වගකීමකි. එමෙන්ම, ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය සහමුලින්ම තුරන් කිරීමේ ජාතික ඉලක්කය සපුරා ගැනීමට ද දෙපාර්තමේන්තුව කැපවී ක්‍රියා කරනු ලබයි.
ඒ අනුව, 2025 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

2.6.1 ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි වලට අදාලව පරීක්ෂණ සිදු කිරීම

ළමා ශ්‍රමය සම්බන්ධයෙන් 2025 වර්ෂයේදී පැමිණිලි 79ක් ලැබී ඇත. පසුගිය වර්ෂයේ ලැබී ඉදිරි කටයුතු කරමින් පැවති පැමිණිලිද සමඟ පැමිණිලි 77ක් විසඳීමට කටයුතු කරන ලදී. මේ අතරින් ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි සංඛ්‍යාව 08ක් වන අතර ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලදී.

ප්‍රස්තාරය 2.15 - 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි වලට අදාලව පරීක්ෂණ සිදු කිරීම



2.6.2 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම නියාමනය කිරීම සහ ප්‍රසූතිකාධාර ආඥා පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම

2025 වර්ෂයේදී ආයතන වෙතින් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා ලද ඉල්ලීම් පරිදි අදාල රාත්‍රී සේවා කොන්දේසි සම්පූර්ණ කරන්නේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබා දීම් 757ක් සිදු කර ඇත. එසේම කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් 2025 වර්ෂයේදී පැමිණිලි 04ක් ලැබී ඇති අතර ඉන් පැමිණිලි 02ක් විසඳීමට කටයුතු කරන ලදී. ඉතිරි පැමිණිලි 02 ක සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පැවතුණි.
ප්‍රසූතිකාධාර ආඥා පනතෙහි විධිවිධාන කඩකිරීම් සම්බන්ධයෙන් 2025 වර්ෂයේදී පැමිණිලි 06 ලැබී තිබුණු අතර එක් පැමිණිල්ලක කටයුතු අවසන් කර ඉතිරි පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරමින් පැවතුණි.

2.6.3 ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම පිණිස කටයුතු කිරීම

දැයේ දුවා දරුවන්ට සිය ළමා කාලය නිදහසේ භුක්ති විඳීමින් විධිමත් අධ්‍යාපන කටයුතු වල යෙදීමේ අයිතිය තහවුරු කිරීම උදෙසා ළමා ශ්‍රමය දිවයිනෙන් තුරන් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් කමිටු ඇතුළු පාර්ශවකරුවන්ගේ සහයෝගය සහිතව වැඩසටහන් රාශියක් 2025 වර්ෂයේදී සිදු කරන ලද. එම වැඩසටහන් පහත පරිදි වේ.

2.6.3.1 ළමා ශ්‍රමය පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

වැඩසටහනේ නම	අරමුණු	පැවැත්වූ පරීක්ෂණ සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව / සහභාගී වූ සංඛ්‍යාව
ධීවර හා වතු ක්ෂේත්‍රයන්හි පවතින ළමා ශ්‍රමයට අවදානම් දරුවන් හඳුනාගැනීම සඳහා ඉලක්ක කරගත් අවදානම් ප්‍රදේශයන්හි විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	තෝරා ගත් ප්‍රදේශයන්හි ළමා ශ්‍රමය පවතිදැයි ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම, ඒ අතරතුර ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳව දේශන පැවැත්වීම, ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීම අත්පත්‍රිකා බෙදීම සහ ශබ්ද විකාශන යන්ත්‍ර මගින් දැනුවත්කිරීම් සිදු කිරීම	35	ආවරණය කරන ලද නිවාස සහ ආයතන සංඛ්‍යාව 1103 කි. ළමා ශ්‍රමයක් ආවරණය වී නොමැත. (ළමා ශ්‍රමයට අවදානම් ළමුන් 29 ක් හඳුනාගෙන ඇති අතර අඛණ්ඩ පසුවිපරම් කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කර ඇත)
නිවාසගත (Home Stay) සහ සත්කාරක සේවා මධ්‍යස්ථාන (Hospitality Service Centers) ද ඇතුලත් වන ආකාරයට සංචාරක ක්ෂේත්‍රය ආවරණය වන පරිදි විශේෂ කණ්ඩායම් පරීක්ෂණ පැවැත්වීම		75	ආවරණය කරන ලද නිවාස සහ ආයතන සංඛ්‍යාව 462 කි. ළමා ශ්‍රමයක් ආවරණය වී නොමැත.

2.6.3.2 ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට සේවා යෝජකයින් වෙතින් ප්‍රතිඥා ලබා ගැනීම

සේවායෝජකයන් වෙතින්, සිය ආයතන විසින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමේ වැඩසටහන 2024 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2025 වර්ෂයේදීද එය අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2025 වර්ෂයේදී කුඩා හා මධ්‍ය පරිමාණ සේවායෝජකයන් වෙත ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 61ක් පැවැත්වීමට කටයුතු කර ප්‍රතිඥා ලබා ගෙන ඇත. 2025 වර්ෂයේදී ප්‍රතිඥා ලබා දුන් සේවා සංඛ්‍යාව 679 කි. ඒ අනුව, 2025.12.31 දින වන විට ප්‍රතිඥා ලබා දී ඇති සමස්ථ සේවායෝජක සංඛ්‍යාව 1240 කි.

2.6.3.3 ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාතික මෙහෙයුම් කමිටුවේ රැස්වීම් සංවිධානය කිරීම

රැස්වීම පැවැත්වූ දිනය	සහභාගි වූ සංඛ්‍යාව	රැස්වීමේදී සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු
2025.03.11	31	• ළමා ශ්‍රමය සම්බන්ධ 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ කෙටුම්පත ඉදිරිපත් කිරීම සහ ඊට අදාල යෝජනා සාකච්ඡා කිරීම • ළමා ශ්‍රමය වැලැක්වීම සඳහා බිම් මට්ටමේ ප්‍රජාව දැනුවත් කිරීමේ අවශ්‍යතාවය සහ වතු ආශ්‍රිතව පවතින Outgrower Systems හරහා ළමා ශ්‍රම අවදානම් තත්ත්වයන් පැහැනැගීමේ අවධානම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම
2025.08.07	44	

2.7 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ මාධ්‍ය මගින් තොරතුරු සන්නිවේදන කටයුතු

2.7.1 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

කම්කරු නීති රීති සහ සේවා නියුක්ති ප්‍රමිතීන් පිළිබඳව සේවකයන් සහ සේවායන් දැනුවත් කිරීම සහ ඒ අනුව නීතිමය ප්‍රතිපාදනයන්හි සඵලදායීතාව තහවුරු කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ සුවිශේෂී කාර්යභාරයක් වේ. මෙම අරමුණ සාක්ෂාත් කරගනු වස්, දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් සේවායෝජකයින්, සේවකයින් සහ මහජනතාව ඉලක්ක කරගනිමින් දීපව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ තුළින් සේවා ස්ථානයන්හි ගැටලු අවම කිරීමත්, කාර්මික සාමය හා සුරක්ෂිතතාව තහවුරු කිරීමත් අපේක්ෂා කෙරේ.

ඒ අනුව, ඉහත පරිච්ඡේදයන් සඳහන් වැඩසටහන් වලට අතිරේකව 2025 වර්ෂයේදී පහත පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

වැඩසටහනේ නම	වැඩසටහනේ ස්වභාවය	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැඩසටහනේ ප්‍රතිඵල
සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සුරක්ෂිතා සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්	සියළුම දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල බල ප්‍රදේශ ආවරණය වන පරිදි කර්මාන්තපුර තෝරාගෙන මූලික සමීක්ෂණ සිදු කිරීමෙන් අනතුරුව සේවා සේවක දැනුවත් කිරීම් සිදු කිරීම	41	සේවායන් සහ සේවකයින් 1720	අනතුරු සහ වෘත්තීය රෝග ඇති වීමේ අවධානම අඩු වීම
අවිධිමත් අංශයේ රැකියා ක්ෂේත්‍රයන්හි වෘත්තීය ස්වස්ථතාව, සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන්	සුපිරි වෙළඳසැල්, ධීවර ප්‍රජාව, වාහන දුම් පරීක්ෂක මධ්‍යස්ථාන, ගිණිකෙලි කර්මාන්තය, කලුගල් කැඩීමේ කර්මාන්තය ආදී තෝරාගන්නා ලද ක්ෂේත්‍රයන්හි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	18	සේවායන් සහ සේවකයින් 1378	වෘත්තීය ස්වස්ථතාව, සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් සහ උපද්‍රවකාරක හඳුනා ගැනීම, පූර්ව ආරක්ෂාව සහ ප්‍රථමාධාර පුහුණුව ලැබීම
සනීපාරක්ෂක සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන්	කොළඹ දිස්ත්‍රික්කය තුළ සේවයේ නියුතු සනීපාරක්ෂක සේවකයින් 1000 කගේ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම.	11	1166	නිවැරදි සෞඛ්‍ය පිළිවෙත්, ලෙඩ රෝග හා වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත් වීම. (අවසාන ඇගයීම අනුව දැනුම වර්ධනයේ ප්‍රතිශතය 72% ක් පමණ ඉහළ අගයක් වේ)
සමාජ කතිකා ප්‍රවර්ධනය සඳහා ආයතන මට්ටමේ වැඩසටහන්	සමාජ කතිකාව පිළිබඳව සේවායන් සහ සේවකයන් දැනුවත් කිරීම	240	සේවායන් සහ සේවකයන් 9,963	සේවායන් සහ සේවකයන් දැනුවත් වීම සහ එම ආයතන තුළ ඉදිරියේදී කාර්මික ආරවුල් ඇති වීමේ ඉඩකඩ අවම

				වීම සහ ආයතනයන්හි සමාජ කතිකා කව 21ක් පිහිටුවීම
සේවයේ නියුතු කාන්තාවන් සඳහා අදාළ වන කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම්	නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ සේවය කරන සේවිකාවන් අදාල වන කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සහ ප්‍රසූතිකාධාර සම්බන්ධයෙන් කම්කරු නීති පිලිබඳව දැනුවත්කිරීම	04	115	දැනුවත්භාවය වර්ධනය වීම



ඡායාරූපය - 2.2
කළුතර - නාගොඩ කර්මාන්තපුරයේ කර්මාන්තශාලා වල සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන - 2025. 07.29





ඡායාරූපය - 2.3
සුපිරිවෙලදසැල් වල සේවයේ නියතු සේවකයින් සඳහා පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන - 2025.04.28

2.7.2 ප්‍රකාශන කටයුතු

- **කතිකාව සහරාව**

ආයතන තුළ සේව්‍ය හා සේවක දෙපාර්ශවය අතර සුහදතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම මඟින් ආරවුල් අවම කිරීම සඳහා දායකත්වය ලබා දීම කතිකාව සහරාව එළි දැක්වීමේ අරමුණ වේ. ඒ අනුව, 2025 වර්ෂය සඳහා වන කතිකාව සහරාව එළිදැක්වීමට කටයුතු කරන ලදී.





- **සාර්ථකත්වයේ තතු (Success Stories) ප්‍රකාශනය**

සමාජ කතිකා වැඩසටහන් තුළින් සිය ආයතනයන්හි සේවා හා සේවක දෙපාර්ශවය අතර සුහදතාවය වර්ධනය කර ගනිමින් ආයතනයේ කාර්යක්ෂමතාවය වර්ධනය කර ගෙන දේශීය ආර්ථිකයට ශක්තියක් වූ ආයතනයන්හි සාර්ථකත්වයේ ගමන් මඟ අනෙකුත් ආයතනයන්ටද ආදර්ශයක් වන අයුරින් ප්‍රකාශයට පත් කිරීම සඳහා අදාළ තොරතුරු රැස්කරන ලදී. ඒ අනුව, මෙම සාර්ථකත්වයේ තතු ඇතුළත් (Success Stories) ප්‍රකාශනය 2025 දී එළිදක්වන ලදී.

- **කම්කරු ක්ෂේත්‍රයට අදාළ සමීක්ෂණ සහ අධ්‍යයනයන්**


- **වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය – 2025 (Survey on working hours and labour cost-2025)**

කම්කරු අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව හා වෙනත් ආයතන වෙත තීරණ ගැනීම සඳහා ඉවහල් වන කම්කරු සංඛ්‍යාති ඉදිරිපත් කිරීම මෙම වාර්තාව සකස් කිරීමේ මූලික අරමුණ වේ. 2025 වර්ෂයේ නොවැම්බර් මාසය දක්වා ප්‍රශ්නාවලි ආයතන වෙත යොමු කර තොරතුරු රැස් කරමින් පවති. ලැබී ඇති ප්‍රශ්නාවලි සංස්කරණය කිරීම හා පරිගණකගත කිරීම සිදුකරමින් පවති.

- **ශ්‍රම ඉල්ලුම පිළිබඳ වාර්තාව (Bullatin of Labour Demand)**

ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ පවතින රැකියා පුරප්පාඩු පිළිබඳ තක්සේරුවක් ලබා ගැනීම මෙම ප්‍රකාශනයේ අරමුණ වේ. 2025 වර්ෂය සඳහා මෙම ප්‍රකාශනය සකස් කර ප්‍රකාශයට පත් කර ඇත.

- **ළමා ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය - 2025 බස්නාහිර පළාත (වතු අංශය)**



කොළඹ දිස්ත්‍රික්කයෙහි ළමා ශ්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය ඇගයීම, ළමා ශ්‍රමිකයන් සිටින පවුල්වල සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ දත්ත රැස් කිරීම සහ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම අරමුණු කර ගනිමින් ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනයක් 2024 වර්ෂයේ දී සිදු කරන ලදි. එහි දෙවන අදියර වශයෙන් බස්නාහිර පළාත තුළ ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2025 වර්ෂයේදී සිදු කර වාර්තාව එළිදක්වන ලදී.

- **දිගු වේලාවක් සිටගෙන සේවයේ නියුතු සේවකයින්ට ඇති විය හැකි සෞඛ්‍ය සංකූලතා පිළිබඳ සිදු කරන නියමු අධ්‍යයනය (A Pilot Study in selected five garment factories to study the impact of prolonged standing on the health of the workers)**

ඇගළුම් කර්මාන්තශාලා වල දිගු වේලාවක් සිටගෙන සේවය කිරීම මඟින් සේවක සේවිකාවන්ට සෞඛ්‍ය ගැටළු ඇති විය හැකි ද යන්න අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. ඇගළුම් නිෂ්පාදන ආයතන 06ක සේවකයින් 13,040ක් ආවරණය කරමින් මෙම අධ්‍යයනය සිදු කර වාර්තාව සකස් කර ඇත.

2.7.3 කම්කරු ක්ෂේත්‍රයට අදාළ ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම

- **ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන 2025**

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2025.03.07 දින දිවයින පුරා විශේෂ දැනුවත්කිරීමේ වැඩසටහන් 11ක් සංවිධානය කර පවත්වන ලදී. මෙහි ප්‍රධාන වැඩසටහන බස්නාහිර 1 කලාප කම්කරු කාර්යාලයේ සම්බන්ධීකරණය මඟින් සිදු කරන ලදී.
මෙම වැඩසටහනට සමගාමීව රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන් මඟින්ද කාන්තාවන්ට බලපාන කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරන ලදී. මෙම වැඩසටහන පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය (YouTube හා Facebook) මඟින්ද ප්‍රචාරය කරන ලදී.




ඡායාරූපය - 2.4
ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන 2025

- **ළමා ශ්‍රම විරෝධී දින වැඩසටහන - 2025**

ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය වෙනුවෙන් කොළඹ උතුර පොලිස් කොට්ඨාසයේ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශය ආවරණය වන පරිදි 2025.06.12 දින ළමා ශ්‍රම විරෝධී පාගමනක් මගින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. එහිදි 300-400 ක අතර පිරිසක් වෙනුවෙන් දැනුවත් කිරීම් සිදුකරන ලදී.








ඡායාරූපය - 2.5
ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය වෙනුවෙන් කොළඹ උතුර පොලිස් කොට්ඨාසයේ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශය ආවරණය වන පරිදි 2025.06.12 දින පැවැත්වූ ළමා ශ්‍රම විරෝධී පාගමන

- **ලෝක ළමා දින සැමරුම් වැඩසටහන - 2025**

සෑම වර්ෂයකම ඔක්තෝබර් 01 වන දිනට යෙදෙන ලෝක ළමා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් ළමා ශ්‍රමය හා අනර්ථකාරී ළමා ශ්‍රමය පිටු දැකීම හා ඒ හා සම්බන්ධ නීති ක්‍රියාත්මක කිරීමෙන් ඔබ්බට යමින් මෙවර ලෝක ළමා දිනයට සමගාමීව යාපනය, හැටන් සහ හලාවත යන ප්‍රදේශයන්හි වැඩසටහන් තුනක් සංවිධානය කර පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා පාසැල් ළමුන් ඔවුන්ගේ දෙමාපියන් ඇතුළු 892 ක් සහභාගී වන ලදී.



- **ලෝක සුරක්ෂිතතා දිනය**

2025.04.28 දිනට යෙදුනු ලෝක සුරක්ෂිතතා දිනය වෙනුවෙන් කර්මාන්තශාලා හා ඉදිකිරීම් වැඩබිම් සේවක සේවිකාවන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා වෘත්තීය ස්වස්ථතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ වෘත්තීය පුහුණුව ලබන තාක්ෂණික විද්‍යාල සිසුන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා වෘත්තීය ස්වස්ථතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳ සතිය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳ සතිය සනිටුහන් කරමින් ප්‍රධාන වැඩසටහන 2015.10.07 දින කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයේ පිහිටි මෙහෙවර පියෙස 30 වන මහල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. එසේම, දිවයිනේ විවිධ ප්‍රදේශයන්හිද සමගාමී වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා 791ක පිරිසක් සහභාගී වී ඇත.


2.7.4 කම්කරු දෙපාර්තමේන්තුවේ "මෙහෙවර යාත්‍රා" මානුෂීය මෙහෙවර



කම්කරු දෙපාර්තමේන්තුව සිය ව්‍යවස්ථාපිත කාර්යභාරයට පමණක් සීමා නොවී, ජාතික ආපදා අවස්ථාවන්හිදී ජනතාවට සහන සැලසීමේ සමාජ වගකීම ද මැනවින් ඉටු කරයි. ඒ අනුව, "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් ජනතාවගේ දුෂ්කරතාවයන් සලකා, කම්කරු මහ ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේ පිහිටි සියලුම ආයතනවල කාර්ය මණ්ඩලය සහ මහජනතාවගේ නොමසුරු දායකත්වයෙන් සහන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී රැස් කර ගන්නා ලද වියළි ආහාර, ඇඳුම් පැළඳුම්, සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය ආධාර තොගයක් 2025.12.03 දින කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නිල වශයෙන් භාර දීමට කටයුතු කරන ලදී.

එසේම, මෙම සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙනුවෙන් සහයෝගය දැක්වීමට ද කටයුතු කරන ලදී. සහෝදර නිලධාරීන් පත් වූ අසීරුතාවයේදී ඔවුන්ගේ සුබසාධනය වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය දැක්වූ මෙම දායකත්වය, ආයතනික සහයෝගීතාවය සහ මානුෂීය බැඳීම ප්‍රදර්ශනය කළ සුවිශේෂී අවස්ථාවක් විය.

2.7.5 ආයතනික සංස්කෘතිය සහ සේවක සහයෝගීතාව




කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය අතර සබැඳියාව වර්ධනය කිරීම වෙනුවෙන් ද දෙපාර්තමේන්තුව සක්‍රීය දායකත්වයක් ලබා දෙයි. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ සේවා වනිතා ඒකකය මඟින් සංවිධානය කරන ලද "පොසොන් බැති ගී සරඹය" 2025.06.19 දින කම්කරු අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව මෙන්ම කම්කරු මහ ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේ පිහිටි අනෙකුත් ආයතනවල ද සාමූහික දායකත්වයෙන් ඉතා සාර්ථක ලෙස පවත්වන ලදී.

2.8 දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණය

2025 වර්ෂයේදී නිලධාරීන් බඳවා ගැනීම්, උසස් වීම්, ස්ථාන මාරු, විශ්‍රාම ගැන්වීම් සහ විනය පාලනය ඇතුළු සියලු දෛනික පරිපාලන කටයුතු නිසි පරිදි ඉටු කරන ලදී. එහිදී නිලධාරීන් 99 දෙනෙකු වෙනුවෙන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 11ක් පවත්වා ඇත.

එසේම, කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් 2025 වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කර ඒ අනුව පුහුණු කටයුතු සිදු කරන ලදී. මෙහිදී අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් මෙන්ම උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීමටද කටයුතු කරන ලදී. දේශීය පුහුණු වැඩසටහන් සඳහා 2025 වර්ෂය සඳහා ලද රු.මි. 15.7 ක ප්‍රතිපාදනයෙන් 2025.12.31 දිනට රු.මි. 13.97 ක වියදමක් දරා ඇති අතර එය වෙන් කල ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස 89% කි. විදේශීය පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා 2025 වර්ෂය තුළදී නිලධාරීන් 14 දෙනෙකු සහභාගී වී ඇත. මෙම පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු 06 පරිච්ඡේදයේ සඳහන් වේ.

ප්‍රස්තාරය 2.16 - 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා දේශීය පුහුණු වැඩසටහන් සඳහා දරන ලද වියදම සහ පුහුණුව ලද නිලධාරීන් සංඛ්‍යාව



කම්කරු නීති ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ගේ දැනුම හා අත්දැකීම් හුවමාරුව සඳහා දෙසතියකට වරක් පවත්වන ලබන 'DoL – E Learning Hub' මාර්ගගත වැඩසටහන 2025 සැප්තැම්බර් මස සිට ආරම්භ කර අඛණ්ඩව සිදු කරන ලදී.

'DoL – E Learning Hub' මාර්ගගත වැඩසටහන පැවැත් වූ දිනය	සාකච්ඡා කරන ලද කරුණු
2025/09/11	කම්කරු නීති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දැනුම හුවමාරු කර ගැනීම
2025/09/25	සේවක අර්ථසාධක අරමුදල් පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධ දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීම
2025/10/09	1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත හා 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල පනත සම්බන්ධ දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීම
2025/10/30	ස්ත්‍රීන්, තරුණ අය හා ළමුන් සේවයේ යෙදවීම සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු හා සාක්ෂි රැස් කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම
2025/11/13	පුද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල පරීක්ෂණ කිරීමේ දී සේවා තත්ත්ව හා කොන්දේසි පිළිබඳව ඇතිවන ගැටළු සාකච්ඡා කිරීම
2025/11/27	කාර්මික ආරවුල් විසඳීම සම්බන්ධව ගැටළු සාකච්ඡා කිරීම
2025/12/18	නඩු විවෘත වරෙන්තු වීම, අක්‍රිය වීම අවම කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු විශේෂ කරුණු හා පැමිණිලි චෝදනා පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සාකච්ඡා කිරීම

2.9 දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය

දිවයින පුරා විසිරී සිටින සේවාලාභීන්ට වඩාත් ඵලදායී සේවයක් සලසා දීමේ අරමුණ පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි සහ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන් හි අවශ්‍යතාවය පරිදි යටිතල පහසුකම් සංවර්ධනයට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.
ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාලයන් හි අවශ්‍යතාවය පරිදි සුළු අළුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර, මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ මහල්වල සහ කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු සිදු කරන ලදී.
කම්කරු දෙපාර්තමේන්තුවේ සේවාලාභීන් වෙත වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණ පෙරදැරිව කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ, මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ සහ දිවයින පුරා විසිරී පවතින කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි භෞතික පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

2.10 දෙපාර්තමේන්තුවේ කාර්ය අධීක්ෂණය මගින් ඉලක්ක කරා මෙහෙයවීම

තිරසර සංවර්ධන අභිමතාර්ථ ආදී ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කම්කරු දෙපාර්තමේන්තුවට අදාළ ක්‍රියාකාරකම් සාක්ෂාත් කර ගත හැකි වන පරිදි දෙපාර්තමේන්තුවේ සේවාලාභීන් වෙත සේවා සැපයීමේ ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම, නූතන තාක්ෂණය භාවිතා කිරීම හා මානව සම්පත් සංවර්ධනය ආදී කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කම්කරු දෙපාර්තමේන්තුවේ 2025-2029 පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 2025 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය වරින් වර සමාලෝචනයට ලක් කරන ලදී.

කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මඟින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කම්කරු කාර්යාල වල ප්‍රගතිය අඛණ්ඩව මාසිකව සහ කාර්තුමය වශයෙන් අධීක්ෂණය සඳහා නව ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

එසේම, කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 07ක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

කම්කරු දෙපාර්තමේන්තුවේ අංශ සහ ප්‍රාදේශීය කාර්යාල භාර ප්‍රධානීන් සඳහා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙහිදී කම්කරු දෙපාර්තමේන්තුවේ වර්තමාන ප්‍රගතිය සහ දෙපාර්තමේන්තුවේ ඉදිරි දිශානතිය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී. මෙම සම්මන්ත්‍රණයේදී ශ්‍රී ලංකා මහ බැංකුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යන බාහිර ආයතන විසින්ද සිය අදහස් දැක්වීම් සිදු කරන ලදී. ඉදිරි වර්ෂයේ සිට මෙම සම්මන්ත්‍රණය වර්ෂයකට දෙවරක් පැවැත්වීමට අපේක්ෂිතය.

2.11 මූල්‍ය කළමනාකරණය

2025 වර්ෂය සඳහා වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලැබූ පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදනයන්ගෙන් 94.12% ක ප්‍රතිශතයක් ද ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රතිපාදනයන්ගෙන් 26.42% ක ප්‍රතිශතයක් ද මේ සඳහා යොදා ගනිමින් මූල්‍ය කළමනාකරණ ඉලක්ක සපුරා ගෙන ඇත.

දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය - 2025.12.31 දිනට			
		2025.12.31 දිනට	**ප්‍රතිපාදනයන් හි ප්‍රතිශතයක් ලෙස සත්‍ය වියදම**
පුනරාවර්තන වියදම්	ප්‍රතිපාදනය (රු)	3,465,900,000	94.12 %
	වියදම (රු)	3,261,947,454	
ප්‍රාග්ධන වියදම්	ප්‍රතිපාදනය (රු)	1,620,000,000	26.42 %
	වියදම (රු)	428,022,894	

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද

කම්කරු කොමසාරිස් ජනරාල්

තෙවන පරිච්ඡේදය

2025 දෙසැම්බර් 31 දිනෙන්

අවසන් වූ වසර සඳහා වන

සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ජීසිජී-එල්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	කණ්ඩායම 2025 රු.	2024 රු.	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ජීසිජී-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අයිමි		1,894,168,000	1,702,735,000	ජීසිජී-3
-	කැන්පතු		5,383,926,423	4,164,557,714	ජීසිජී-4
-	අත්තිකාරම් ගිණුම්		127,815,172	131,681,603	ජීසිජී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		26,330	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**7,405,935,925**	5,998,974,317	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**7,405,935,925**	**5,998,974,317**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		26,330	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**7,405,909,595**	**5,998,974,317**	
	අඩු කළා : වියදම්				
-	**ප්‍රතිලාභ**				
2,248,700,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	2,223,721,307	1,967,273,776	
1,097,500,418	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	924,783,390	892,596,065	ජීසිජී-2(ii)
119,649,582	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	113,442,756	13,034,578	
-	පොළී ගෙවීම්	8	-	-	
50,000	වෙනත් ප්‍රතිලාභ වියදම්	9	-	498,139	
3,465,900,000	**මුළු ප්‍රතිලාභ වියදම් (ඊ)**		**3,261,947,454**	**2,873,402,559**	
	මූලධන වියදම්				
1,162,300,000	මූලධන වත්කම් ප්‍රතිරූපණය හා වැඩිදියුණු කිරීම්	10	319,611,520	257,261,044	
442,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	94,437,380	50,063,883	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-		ජීසිජී-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
15,700,000	හැකියා වර්ධනය	14	13,973,993	8,546,920	
-	වෙනත් මූලධන වියදම්	15	-	287,485	
1,620,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**428,022,894**	**316,159,332**	
	කැන්පතු ගෙවීම්		5,355,511,280	4,280,930,828	ජීසිජී-4
	අත්තිකාරම් ගෙවීම්		113,115,322	125,267,485	ජීසිජී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**5,468,626,602**	**4,406,198,313**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**9,158,596,949**	**7,595,760,204**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(1,752,687,354)**	**(1,596,785,887)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**(1,752,687,354)**	(1,609,554,880)	ජීසිජී-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	12,768,993	ජීසිජී-3
			(1,752,687,354)	(1,596,785,887)	

3.2 2025.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	18,083,446,782	17,989,260,234
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	252,993,052	267,692,902
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	12,768,993
මුළු වත්කම්		**18,336,439,834**	**18,269,722,130**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		206,470,766	(578,590,517)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		18,083,446,782	17,989,260,234
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	46,522,286	846,283,419
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	12,768,993
මුළු වගකීම්		**18,336,439,834.18**	**18,269,722,130**

2025.12.31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පිටු අංක 9 සිට 48 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 49 සිට 58 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම : එස්.එම්. පියතිස්ස ලේකම් කම්කරු අමාත්‍යාංශය 7 වන මහල, "මිහෙව්වර පියස",	නම : ඩබ්.එම්.ඩී.එන්.කේ. වටලියද්දි කම්කරු කොමසාරිස් ජනරාල් කම්කරු දෙපාර්තමේන්තුව කොළඹ 05.	නම :
තනතුර : නාරාහේන්පිට, කොළඹ 05.	තනතුර :	දිනය : 2026.02. 24
දිනය : 2026.02. 26	දිනය : 2026.02. 25	එස්.එස්. ගිරෝමා නන්දනී ප්‍රධාන ගණකාධිකාරී (වැ.බ.) කම්කරු දෙපාර්තමේන්තුව කොළඹ 05.

3.3 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒඩීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කක්‍ෂ	
	2025 රු.	සංශෝධිත **2024** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	26,330	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	1,773,291,592	1,612,476,844
අග්‍රිම ලැබීම්	1,894,168,000	1,702,735,000
අත්තිකාරම් අයකර ගැනීම්	130,921,443	143,085,055
තැන්පතු ලැබීම්	5,383,926,423	4,164,557,714
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**9,182,333,788**	**7,622,854,613**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනාඩි හා මෙහෙයුම් වියදම්	3,138,569,329	2,845,654,575
සහනාධාර සහ මාරුකිරීම්	113,442,756	13,532,717
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	328,908,935	-
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	50,498,426	36,886,503
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	26,330	-
අත්තිකාරම් ගෙවීම්	113,708,345	125,815,190
තැන්පතු ගෙවීම්	5,355,511,280	4,280,930,828
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**9,100,665,401**	**7,302,819,814**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**81,668,387**	**320,034,799**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අක්ෂත් කර ගැනීම්	94,437,380	307,265,806
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ඉ)	**94,437,380**	**307,265,806**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(94,437,380)**	**(307,265,806)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(12,768,993)**	**12,768,993**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(12,768,993)**	**12,768,993**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**12,768,993**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**12,768,993**

3.4 මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

වාර්තා කිරීමේ පදනම

1)පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකිරීමේ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

*තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ.					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන	තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
පුනරාවර්තන	3,465,900,000	3,261,947,454	94.12 %
මූලධන	1,620,000,000	428,022,894	26.42 %

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව		ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ක් ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
1	මැතිවරණ කොමිෂන් සභාව	020-1-1-7-1409	මැතිවරණ රාජකාරී කටයුතු සිදුකිරීම වෙනුවෙන් දීමනා ගෙවීම.	25,086,872.39	25,086,872.39	25,086,872.39	100%
2	කම්කරු අමාත්‍යාංශය	193-1-2-0-1403-11	ජල හා විදුලිය වෙනුවෙන් වියදම් දැරීම.	2,091,052.30	2,091,052.30	2,091,052.30	100%
3	කම්කරු අමාත්‍යාංශය	193-1-2-0-1404-11	බදු කුලී වියදම් දැරීම.	1,555,092.00	1,555,092.00	1,555,092.00	100%
4	කම්කරු අමාත්‍යාංශය	193-1-2-0-1409-11	මෙහෙවර පියෙස පහසුකම් කළමනාකරණ ගාස්තු.	100,329.78	100,329.78	100,329.78	100%
5	කම්කරු අමාත්‍යාංශය	193-1-2-2-2509-11	සුනිසි මෙහෙවර වැඩසටහන වෙනුවෙන් වියදම් දැරීම.	23,526,000.00	23,526,000.00	17,154,017.31	73%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2,865,777,749.65	2,865,777,749.65		100%
9152	යන්ත්‍රෝපකරණ	878,140,872.65	878,140,872.65		100%
9153	ඉඩම්	2,262,720,000.00	2,262,720,000.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	52,351,728.54	52,351,728.54		100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරිගෙන යන වැඩ	12,024,456,431.00	12,024,456,431.00		100%
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/B/DOL/SR/01/2025 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2026 ජූනි 25 දින

ගණන්දීමේ නිලධාරී
කම්කරු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 17 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කම්කරු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන

සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදලේ පරිපාලන කටයුතු සඳහා වැයකරන මුදල් මාසිකව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රතිපූරණය කරගන්නා අතර, 2025 වර්ෂයේදී එලෙස ප්‍රතිපූරණය කරගත් රු.1,186,217,008 ක මුදල ආදායම් ශීර්ෂයකට බැර කිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ලෙස සාවද්‍ය අගයක් සටහන්ව පැවතුණි.

1.6.2 මූලධන වියදම්

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුලත් වත්කම් අයිතම තුනක එකතු පිරිවැය වටිනාකම් රු.15,567,596,344 ක් වුවද සිගාස් මෘදුකාංගයෙහි ඇතුලත් පිරිවැය වටිනාකම් රු.14,930,209,244 ක් වූයෙන් රු.637,387,100 ක වෙනසක් පැවතුණි.

(ආ) භාණ්ඩාගාර වගුව (SA 82) හි ඇතුලත් රු.54,040,529 ක් වූ වත්කම් අයිතම දෙකක වටිනාකම් සිගාස් මෘදුකාංගයෙහි (Boss report) තුල වාර්තා වී නොතිබුණි.

(ඇ) කම්කරු දෙපාර්තමේන්තුවට අයත් නොවූ එකතු වටිනාකම් රු.7,845,000 ක් වූ රථවාහන 09 ක් දෙපාර්තුමේන්තුව සතු රථවාහන ලෙස සිගාස් මෘදුකාංගය අනුව වාර්තාකර තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව සතු එකතු වටිනාකම් රු.88,825,000 ක් වූ රථවාහන 16 ක් සිගාස් මෘදුකාංගය අනුව දෙපාර්තමේන්තුව සතු වාහන ලෙස වාර්තාකර නොතිබුණි.

(ඉ) 2025 වර්ෂයේදී අත්පත් කරගන්නා ලද ගොඩනැලි හා ඉදි කිරීම් (මෙහෙවර පියස අභ්‍යන්තර නිර්මිතය සැකසීම) වැය ශීර්ෂයෙහි ඇතුලත් රු.13,544,617 ක් ස්ථාවර වත්කම් සිගාස් මෘදුකාංගයෙහි ස්ථාවර වත්කම් ලෙස වාර්තා කර නොතිබුණි.

(ඊ) සේවක අර්ථසාධක අරමුදලේ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන තුලින් දරන ලද වියදම් ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ප්‍රතිපූරණය කරගැනීම හා එලෙස ප්‍රතිපූරණය කළ මුදල් කම්කරු

දෙපාර්තමේන්තුවේ අදාල වැය විෂයන්ට අධිභාර කිරීම කලයුතු වුවද, රු.1,186,217,008 ක් වූ වියදම් සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් දරන ලද එකී ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි.

1.6.3 තැන්පතු ගිණුම් ශේෂ

දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය අනුව ටෙන්ඩර් තැන්පත් සහ තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු වශයෙන් ගිණුම් දෙකක් පැවතියද 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල රු.828,176,276 ක් වූ තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ශේෂය ඇතුලත් කර නොතිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.447(7) ප්‍රකාරව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත) ලෙජයෙහි ශේෂ ප්‍රතිපාදනය ගිණුම් එක් එක් මාසයේ අවසාන දිනයට තුලනය කලයුතු වුවද, පුනරාවර්තන වියදම්වලට අදාල වැය ලෙජර නිසි පරිදි තුලනය කර නොතිබුණි අවස්ථා 2 කදී එකතු වටිනාකම රු.15,274,786 ක් වූ වත්කම් මිලදීගැනීම් අදාල වැය ලෙජරයන්හි සටහන්ව නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුනු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ) 1.6.1 (ආ)	මූල්‍ය ප්‍රකාශනවල සේවක අර්ථසාධක අරමුදලෙන් ප්‍රතිපූර්ණය කරගන්නා වියදම් සම්බන්ධව මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කටයුතු කල යුතුය.	1.6.1

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේදී ශීර්ෂ 221 යටතේ පුනරාවර්තන වැය විෂයයන් 67 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 18 ක් සඳහා පිළිවෙලින් රු.මිලියන 2447.76 ක් හා රු.මිලියන 933 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ අවසාන වනවිට මුළු ප්‍රතිපාදනයෙන් වැය විෂයයන් 41 ක්

වෙනුවෙන් වෙන්කරන ලද රු.මිලියන 799.535 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, ඒ අතුරින් වැය විෂයයන් 12 ක මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි වී තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලේ කාර්යයන් සඳහා ප්‍රතිපාදන තුලින් දරන ලද වියදම ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ප්‍රතිපූරණය කරගැනීම හා එලෙස ප්‍රතිපූරණය කළ මුදල කම්කරු දෙපාර්තමේන්තුවේ අදාල වැය විෂයයන්ට අයභාර කිරීම කලයුතු වුවද, එකී ක්‍රමවේදය අනුගමනය නොකිරීම හේතුවෙන් 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් රු.1,186,217,008 ක් වූ වියදම් සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලද වියදම් ලෙස නැවත වාර්තා කර තිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල් අංශයේ වියදම් දැරීමට ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන්කර නිබියදී ඊට අදාල වියදම් කම්කරු දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු සහ ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වැය විෂයයන් මඟින් අවස්ථා දෙකකදී රු.663,034 ක වියදමක් දරා තිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2025 දෙසැම්බර් 31 දිනට හඳුනාගත් බැරකම් අතර වැය විෂයයන් 6 කට අදාල රු.16,534,131 ක් වූ බැරකම් 2026 වර්ෂයේ වැය ලෙජර තුල හඳුනාගෙන නොතිබුණි.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වැය විෂයයන් 04 කට අදාල රු.475,226 ක බැරකම් සමාලෝචිත වර්ෂයේදී වියදම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත	
	(i) පනතේ අංක 10(ආ) (4) වගන්තිය	පනතෙහි විධිවිධාන ප්‍රකාරව කම්කරු කොමසාරිස් විසින් නිශ්චිතවම දක්වා ඇති මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකාව තුල අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොලී දරන ගිණුමක තැන්පත් කිරීමට කටයුතු සැලැස්විය යුතු වුවද, සිදු කරන ලද නියැදි පරීක්ෂාවකදී අවස්ථා 3 කට අදාලව රු.5,582,180 ක් එසේ කිරීමෙන් තොරව පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.
	(ii) පනතේ අංක 10(2) වගන්තිය	සේවායෝජකයන් විසින් තැන්පත් කරන ලද රු.109,882,193 ක් වූ මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් තොරව පොදු තැන්පතු ගිණුමේ රඳවා තබාගෙන ගෙවීම් සිදුකර අදාල තැන්පතුවලින් ගෙවා අවසන් වූ ඉතිරි මුදල වූ රු.5,163,326 ක්ද සමාලෝචිත වර්ෂයේ පොදු තැන්පතු ගිණුමේ රඳවා තබාගෙන තිබුණි.

(ආ) 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත

(i) 97 වගන්තිය

ආඥාපනත ප්‍රකාරව කර්මාන්තශාලා උපදේශක මණ්ඩලයක් ඇතිවිය යුතු නමුත් එවැනි කමිටුවක් සඳහා අවශ්‍ය රෙගුලාසි සම්මත කර අවශ්‍ය උපදෙස් හා නියෝගයන් පැනවීමක් සිදුවී නොතිබුණි.

(ii) 100 වගන්තිය

කර්මාන්තශාලා ආඥාපනත යටතේ වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සම්බන්ධව වෘත්තීය ස්වස්ථතා අංශයේ පර්යේෂණ නිලධාරීන්ගේ බලතල දක්වා නොමැති අතර, වගන්තිය ප්‍රකාරව පරීක්ෂකගේ බලතල වෙනත් නිලධාරියෙකුට පාවිච්චි කිරීමට ගැසට්පත්‍රයේ ආඥාවක් පැවරීමෙන් ඇමතිවරයාට ප්‍රකාශ කලහැකි වුවද, එවැනි ගැසට් නිවේදනයක් පලකර නොතිබුණි.

(iii) පනතේ (දෙවන කොටස-සනීපය පිළිබඳ සාමාන්‍ය විධිවිධාන) 12(2) වගන්තිය

කර්මාන්තශාලාවක් සඳහා ප්‍රමාණවත් වාතාශ්‍රය ලැබීමේ මානයන් නියෝග මඟින් නියම කල යුතු වුවද එවැනි සුදුසු මානයන් සම්පාදනය වී ගැසට්පත්‍ර මඟින් ප්‍රසිද්ධ කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXXIV පරිච්ඡේදය 4.2.4 හා 4.2.5

(i) ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මියගොස් වසර 1 ත් 10 ත් අතර කාල පරාසයක් ගතවී ඇති නිලධාරීන් සිව්දෙනකුගේ අයවිය යුතු රු.292,752 ක ණය ශේෂයන් අයකරගැනීමට නොහැකිව පැවති අතර, මේ අතුරින් නිලධාරීන් තිදෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනුද ලේඛනාගාරය වෙත යොමුකර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම ගිය නිලධාරීන් 26 දෙනකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.1,496,093 ක් වූ අතර විශ්‍රාම ගොස් වසර 2 ඉක්මවූ නිලධාරීන් 4 දෙනකුට අදාලව අයවිය යුතු ශේෂ රු.442,275 ක් අයකරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සේවය අතහැරගොස්, සේවය අවසන් කල හා සේවයෙන් පහකල නිලධාරීන් 17 දෙනෙකුගේ ණය ශේෂයන් රු.1,194,969 ක් වූ අතර ණය අයකරගත නොහැකි අවස්ථාවලදී සියලු ක්‍රියාමාර්ග ගෙන අවසානයේ නීතිපති උපදෙස් පතා යොමුකල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

කම්කරු අයිතීන් ආරක්ෂා කරමින්, තහවුරු කරන ලද කාර්මික සාමය සහිත සුනිසි වැඩ පරිසරයක් තුලින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීමේ මෙහෙවර පෙරදැරි කම්කරු දෙපාර්තමේන්තුවේ එකී කාර්යභාරය ඉටුකරගැනීමට ස්ථාපිත අංශයන්හි මහජන සේවාවන් ඉටුකිරීමට අදාල නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) සේවා ස්ථානයන්හි අනතුරු අවම කරමින් ආරක්ෂිත ශ්‍රම බලකායක් බිහි කිරීමේ කාර්යභාරය පෙරදැරිව 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 අතුරින් ගාල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලවල කාර්යයන් පරීක්ෂාවේදී ආඥාපනතේ 12(1) හා 13(1) වගන්ති ප්‍රකාරව ශබ්දය හා ආලෝකය පිළිබඳ භෞතික පරිසරයේ මිනුම් ලබාගැනීම හා ඊට අදාල වාර්තා ලබාදීමට අවශ්‍ය වන රසායනාගාර උපකරණ හෝ මිනුම් උපකරණ කිසිවක් කාර්යාල සතුව නොපවතින බවට අනාවරණය විය.

(ආ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සම්බන්ධව නීතිමය කටයුතු සඳහා විශේෂඥ සාක්ෂි සැපයීම දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලයක කාර්යභාරය වුවද, ඊට අවශ්‍ය විශේෂඥ මානව සම්පත් ප්‍රමාණාත්මක නොවන බවට අනාවරණය විය.

(ඇ) ශ්‍රමිකයන්ගේ වෘත්තීය රෝගවලට ගොදුරුවීම වැලැක්වීම සඳහා සේවා පරිසරයේ සෞඛ්‍යාරක්ෂිත බව විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ පරීක්ෂා කිරීම, එම තත්ත්වයන් වලක්වා ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීම සහ නිරන්තර පසුවිපරම් කිරීමේ කාර්යය පෙරදැරිව පිහිටුවා ඇති වෘත්තීය ස්වස්ථතා අංශයේ කම්කරු කොමසාරිස් (වෘත්තීය ස්වස්ථතා) තනතුර සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ (1 පන්තිය) හෝ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ (1 පන්තිය) නිලධාරියෙකු සේවයේ යෙදවිය යුතු වුවද, එම කාර්යය ඉටුවී නොතිබුණි මේ හේතුවෙන් වෘත්තීය ස්වස්ථතා අංශයේ ප්‍රධාන කාර්යභාර්යයන් වන ජීව විද්‍යාත්මක හා වෛද්‍ය විද්‍යාත්මක පරීක්ෂණ කිරීම, විශේෂඥ සාක්ෂි සැපයීම, වෛද්‍ය මණ්ඩලවල කාර්යභාරය ඉටුකිරීම ඇතුළු වෘත්තීය ස්වස්ථතාවයට අදාල කාර්යභාර්යයන් විධිමත්ව ඉටුකිරීමට බාධාවී පැවතුණි.

(ඈ) පෞද්ගලික අංශයේ සේවකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුහසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවාතත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබාදීම පිණිස පවතින ශ්‍රම ප්‍රමිති අංශය විසින් පඩිපාලක සහා 36 ක් අතුරින් කර්මාන්ත 07 කට අදාලව පඩිපාලක සහා පමණක් සක්‍රීය කර පවතින බවට අනාවරණය විය.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

දෙපාර්තමේන්තුවේ ස්වස්ථතා අංශයේ පාරිසරික මිනුම්කරණය ප්‍රධාන කාර්යභාරයක් වන අතර, ඒ සඳහා අවශ්‍ය වන සුක්ෂම නවීන මිනුම් උපකරණ රසායනාගාරය සතුව නොමැති අතර, අවදානම් සහිත ක්ෂේත්‍රවල කර්මාන්තශාලා හඳුනාගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් නොමැති බවට නිරීක්ෂණය විය.

4.2 වත්කම් කළමනාකරණය

වෘත්තීය ස්වස්ථතා අංශයේ රසායනාගාරය සතුව පැවති ලෝහ දූෂණ පරීක්ෂණ විශ්ලේෂණ ක්‍රියාවලියට භාජනය කරනු ලබන උපකරණයක් අපහරණය කර තිබූ අතර, එම උපකරණය සමග භාවිතයට ගන්නා වෙනත් අයිතම 5 ක් නිශ්ක්‍රීයව පැවතුණි. එම රසායනාගාරය තුළ පවතින උපකරණ බහුතරයක් භාවිතාකරන ආකාරය පිළිබඳ නිලධාරීන්ට අවබෝධයක් නොමැති වීම හේතුවෙන් නිෂ්ක්‍රීය හා ප්‍රදර්ශන භාණ්ඩ වශයෙන් පැවතුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

(අ) මෙහෙවර පියස ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මිත සැකසීමට අදාලව 2021 වර්ෂයේ දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද රු.329,965,099 ක මුදලට අදාල කාර්යභාරය සඳහා ප්‍රතිපාදන සියල්ල වැයවී නොතිබුණු අතර, ඉතිරි ප්‍රතිපාදන රු.81,865,718 ක් පවරාගැනීම හෝ වෙනයම් කාර්යභාරයකට යෙදවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අංශවල බඩු වට්ටෝරු පොත් පවත්වා ගැනීමේ දී අදාල භාණ්ඩ නිවැරදිව පරීක්ෂා කිරීමට හා හඳුනාගැනීමට සුදුසු සලකුණු කර අංක කිරීම් සිදුකර නොමැති අතර, එක් එක් අංශ සතු යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හඳුනාගැනීමේ ක්‍රමවේදයක් සකසා නොතිබුණි.

(ඇ) 2023 වර්ෂයේ දී රු.7,855,576 ක මුදලක් වැයකර හම්බන්තොට දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හා සංචාරක බංගලාව අළුත්වැඩියා කර තිබුනද, අවශ්‍ය ලීබඩු හා උපකරණ ප්‍රසම්පාදනය නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වනවිටත් නිෂ්ක්‍රීයව පැවතුණි.

5 යහපාලනය

